# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016

# ඇගයීම් වාර්තාව

## 62 - පුරවැසි අධ්‍යාපනය

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
NETS

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016
# ඇගයීම් වාර්තාව

# 62 - පුරවැසි අධ්‍යාපනය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

**පුරවැසි අධ්‍යාපනය (62)**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016


## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය
ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) හා
අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම  අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස් කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

පුරවැසි අධ්‍යාපනය විෂයයෙහි I හා II පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘතියට අනුව තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තූතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2019 ජනවාරි 22
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | මනෝමි සෙනෙවිරත්න<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **විෂය සම්බන්ධීකරණය** | : | එල්. ජී. එස්. සමරකෝන්<br>සහකාර විභාග කොමසාරිස්<br><br>නිමාලි සූරිය ආරච්චි<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ඒ. එල්. එස්. අබේවික්‍රම<br>ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>මහරගම. |
| **සැකසුම් කමිටුව** | : | ඒ. ඒ. නිලියා උපසේන<br>ගුරු සේවය I<br>බප/ හෝ/ ජල්තර මහා විද්‍යාලය<br>හංවැල්ල.<br><br>ඒ.ඒ.සී. දමයන්ති අධිකාරි<br>ගුරු සේවය I<br>ගම්/ රත්නාවලී බාලිකා විද්‍යාලය<br>ගම්පහ.<br><br>ඩබ්. ආනන්ද මංගලසිරි<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කොළඹ. |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඕ. එම්. ඩී. සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය සැකසුම** | : | එස්. එච්. සමන් කුමාර<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

# ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
12.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 12
2.1.2 I ප්‍රශ්න පත්‍රය 13
2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 17
2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (විෂය ක්ෂේත්‍ර අනුව) 18
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 19
2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 20

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 21
2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න තොරාගෙන ඇති ආකාරය සහ ප්‍රශ්නවල පහසුතාව 22
2.2.3 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23

III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 44
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 46

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

* ප්‍රජාතන්ත්‍රවාදයට ගරුකරන නීතිගරුක පුරවැසියකු වෙයි.
* පරිසරටයට සංවේදීව කටයුතු කරයි.
* විවිධ ජනවර්ග, සමඟ සහජීවනයෙන් කටයුතු කරයි.
* අන්‍ය සංස්කෘතීන් ඇගයීමට ලක් කරයි.
* ඵලදායී ආර්ථික කටයුතු තුලින් තිරසාර සංවර්ධනයට දායක වෙයි.
* ගැටුම් අවම කරගත් සාමකාමී ජීවන රටාවකට හුරු වෙයි.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 81875 | 163 | 82038 |
| දෙමළ | 20252 | 186 | 20438 |
| ඉංග්‍රීසි | 334 | 213 | 547 |
| **එකතුව** | **102461** | **562** | **103023** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 13721 | 13.39 | 52 | 9.25 | 13773 | 13.37 |
| B | 12179 | 11.89 | 45 | 8.01 | 12224 | 11.87 |
| C | 26020 | 25.40 | 89 | 15.84 | 26109 | 25.34 |
| S | 28821 | 28.13 | 140 | 24.91 | 28961 | 28.11 |
| W | 21720 | 21.20 | 236 | 41.99 | 21956 | 21.31 |
| එකතුව | **102461** | **100.00** | **562** | **100.00** | **103023** | **100.00** |

වගුව 2

### 1.2.3 ප්‍රථමවරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 6862 | 940 | 13.70 | 679 | 9.90 | 1546 | 22.53 | 1988 | 28.97 | 5153 | 75.09 | 1709 | 24.91 |
| 2. ගම්පහ | 8208 | 860 | 10.48 | 821 | 10.00 | 1973 | 24.04 | 2450 | 29.85 | 6104 | 74.37 | 2104 | 25.63 |
| 3. කළුතර | 5161 | 906 | 17.55 | 668 | 12.94 | 1201 | 23.27 | 1374 | 26.62 | 4149 | 80.39 | 1012 | 19.61 |
| 4. මහනුවර | 6549 | 1221 | 18.64 | 852 | 13.01 | 1647 | 25.15 | 1568 | 23.94 | 5288 | 80.75 | 1261 | 19.25 |
| 5. මාතලේ | 2636 | 405 | 15.36 | 394 | 14.95 | 743 | 28.19 | 637 | 24.17 | 2179 | 82.66 | 457 | 17.34 |
| 6. නුවරඑළිය | 3899 | 317 | 8.13 | 354 | 9.08 | 995 | 25.52 | 1263 | 32.39 | 2929 | 75.12 | 970 | 24.88 |
| 7. ගාල්ල | 5265 | 747 | 14.19 | 728 | 13.83 | 1444 | 27.43 | 1468 | 27.88 | 4387 | 83.32 | 878 | 16.68 |
| 8. මාතර | 3970 | 858 | 21.61 | 599 | 15.09 | 1006 | 25.34 | 1018 | 25.64 | 3481 | 87.68 | 489 | 12.32 |
| 9. හම්බන්තොට | 4173 | 758 | 18.16 | 649 | 15.55 | 1299 | 31.13 | 987 | 23.65 | 3693 | 88.50 | 480 | 11.50 |
| 10. යාපනය | 3673 | 94 | 2.56 | 140 | 3.81 | 488 | 13.29 | 1149 | 31.28 | 1871 | 50.94 | 1802 | 49.06 |
| 11. කිලිනොච්චි | 721 | 15 | 2.08 | 24 | 3.33 | 111 | 15.40 | 247 | 34.26 | 397 | 55.06 | 324 | 44.94 |
| 12. මන්නාරම | 482 | 28 | 5.81 | 35 | 7.26 | 121 | 25.10 | 203 | 42.12 | 387 | 80.29 | 95 | 19.71 |
| 13. වව්නියාව | 686 | 20 | 2.92 | 44 | 6.41 | 162 | 23.62 | 247 | 36.01 | 473 | 68.95 | 213 | 31.05 |
| 14. මුලතිව් | 542 | 16 | 2.95 | 33 | 6.09 | 117 | 21.59 | 207 | 38.19 | 373 | 68.82 | 169 | 31.18 |
| 15. මඩකලපුව | 5038 | 337 | 6.69 | 376 | 7.46 | 1066 | 21.16 | 1662 | 32.99 | 3441 | 68.30 | 1597 | 31.70 |
| 16. අම්පාර | 5113 | 770 | 15.06 | 742 | 14.51 | 1516 | 29.65 | 1368 | 26.76 | 4396 | 85.98 | 717 | 14.02 |
| 17. ත්‍රිකුණාමලය | 1804 | 168 | 9.31 | 190 | 10.53 | 409 | 22.67 | 606 | 33.59 | 1373 | 76.11 | 431 | 23.89 |
| 18. කුරුණෑගල | 9159 | 1438 | 15.70 | 1245 | 13.59 | 2516 | 27.47 | 2398 | 26.18 | 7597 | 82.95 | 1562 | 17.05 |
| 19. පුත්තලම | 3435 | 495 | 14.41 | 396 | 11.53 | 900 | 26.20 | 1002 | 29.17 | 2793 | 81.31 | 642 | 18.69 |
| 20. අනුරාධපුරය | 5920 | 777 | 13.13 | 715 | 12.08 | 1607 | 27.15 | 1711 | 28.90 | 4810 | 81.25 | 1110 | 18.75 |
| 21. පොළොන්නරුව | 2310 | 260 | 11.26 | 280 | 12.12 | 625 | 27.06 | 684 | 29.61 | 1849 | 80.04 | 461 | 19.96 |
| 22. බදුල්ල | 4962 | 688 | 13.87 | 666 | 13.42 | 1333 | 26.86 | 1374 | 27.69 | 4061 | 81.84 | 901 | 18.16 |
| 23. මොණරාගල | 2949 | 377 | 12.78 | 398 | 13.50 | 798 | 27.06 | 814 | 27.60 | 2387 | 80.94 | 562 | 19.06 |
| 24. රත්නපුරය | 5441 | 783 | 14.39 | 726 | 13.34 | 1497 | 27.51 | 1418 | 26.06 | 4424 | 81.31 | 1017 | 18.69 |
| 25. කෑගල්ල | 3503 | 443 | 12.65 | 425 | 12.13 | 900 | 25.69 | 978 | 27.92 | 2746 | 78.39 | 757 | 21.61 |
| **සමස්ත දිවයින** | **102461** | **13721** | **13.39** | **12179** | **11.89** | **26020** | **25.40** | **28821** | **28.13** | **80741** | **78.80** | **21720** | **21.20** |

වගුව 3

## 1.2.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 1768 | 351 | 19.85 | 185 | 10.46 | 331 | 18.72 | 448 | 25.34 | 1315 | 74.38 | 453 | 25.62 |
| 2. හෝමාගම | 1379 | 167 | 12.11 | 125 | 9.06 | 277 | 20.09 | 383 | 27.77 | 952 | 69.04 | 427 | 30.96 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 2176 | 236 | 10.85 | 204 | 9.38 | 549 | 25.23 | 712 | 32.72 | 1701 | 78.17 | 475 | 21.83 |
| 4. පිළියන්දල | 1539 | 186 | 12.09 | 165 | 10.72 | 389 | 25.28 | 445 | 28.91 | 1185 | 77.00 | 354 | 23.00 |
| 5. ගම්පහ | 2040 | 283 | 13.87 | 255 | 12.50 | 479 | 23.48 | 552 | 27.06 | 1569 | 76.91 | 471 | 23.09 |
| 6 මිනුවන්ගොඩ | 1734 | 233 | 13.44 | 209 | 12.05 | 459 | 26.47 | 470 | 27.10 | 1371 | 79.07 | 363 | 20.93 |
| 7. මීගමුව | 1931 | 165 | 8.54 | 146 | 7.56 | 410 | 21.23 | 561 | 29.05 | 1282 | 66.39 | 649 | 33.61 |
| 8. කැලණිය | 2503 | 179 | 7.15 | 211 | 8.43 | 625 | 24.97 | 867 | 34.64 | 1882 | 75.19 | 621 | 24.81 |
| 9. කළුතර | 1751 | 215 | 12.28 | 183 | 10.45 | 382 | 21.82 | 530 | 30.27 | 1310 | 74.81 | 441 | 25.19 |
| 10. මතුගම | 1606 | 442 | 27.52 | 263 | 16.38 | 393 | 24.47 | 331 | 20.61 | 1429 | 88.98 | 177 | 11.02 |
| 11. හොරණ | 1804 | 249 | 13.80 | 222 | 12.31 | 426 | 23.61 | 513 | 28.44 | 1410 | 78.16 | 394 | 21.84 |
| 12. මහනුවර | 2290 | 663 | 28.95 | 336 | 14.67 | 576 | 25.15 | 443 | 19.34 | 2018 | 88.12 | 272 | 11.88 |
| 13. දෙනුවර | 561 | 95 | 16.93 | 95 | 16.93 | 144 | 25.67 | 130 | 23.17 | 464 | 82.71 | 97 | 17.29 |
| 14. ගම්පොල | 1268 | 173 | 13.64 | 119 | 9.38 | 283 | 22.32 | 346 | 27.29 | 921 | 72.63 | 347 | 27.37 |
| 15. තෙල්දෙණිය | 757 | 99 | 13.08 | 96 | 12.68 | 203 | 26.82 | 190 | 25.10 | 588 | 77.68 | 169 | 22.32 |
| 16. වත්තේගම | 771 | 80 | 10.38 | 88 | 11.41 | 208 | 26.98 | 212 | 27.50 | 588 | 76.26 | 183 | 23.74 |
| 17. කටුගස්තොට | 902 | 111 | 12.31 | 118 | 13.08 | 233 | 25.83 | 247 | 27.38 | 709 | 78.60 | 193 | 21.40 |
| 18. මාතලේ | 1214 | 240 | 19.77 | 190 | 15.65 | 320 | 26.36 | 280 | 23.06 | 1030 | 84.84 | 184 | 15.16 |
| 19. ගලේවෙල | 1031 | 108 | 10.48 | 141 | 13.68 | 323 | 31.33 | 272 | 26.38 | 844 | 81.86 | 187 | 18.14 |
| 20. නාඋල | 188 | 32 | 17.02 | 33 | 17.55 | 57 | 30.32 | 33 | 17.55 | 155 | 82.45 | 33 | 17.55 |
| 21. විල්ගමුව | 203 | 25 | 12.32 | 30 | 14.78 | 43 | 21.18 | 52 | 25.62 | 150 | 73.89 | 53 | 26.11 |
| 22. නුවරඑළිය | 1159 | 52 | 4.49 | 102 | 8.80 | 330 | 28.47 | 387 | 33.39 | 871 | 75.15 | 288 | 24.85 |
| 23. කොත්මලේ | 706 | 64 | 9.07 | 57 | 8.07 | 159 | 22.52 | 221 | 31.30 | 501 | 70.96 | 205 | 29.04 |
| 24. හැටන් | 983 | 57 | 5.80 | 67 | 6.82 | 263 | 26.75 | 378 | 38.45 | 765 | 77.82 | 218 | 22.18 |
| 25. වලපනේ | 453 | 76 | 16.78 | 63 | 13.91 | 108 | 23.84 | 109 | 24.06 | 356 | 78.59 | 97 | 21.41 |
| 26. හඟුරන්කෙත | 598 | 68 | 11.37 | 65 | 10.87 | 135 | 22.58 | 168 | 28.09 | 436 | 72.91 | 162 | 27.09 |
| 27. ගාල්ල | 2125 | 321 | 15.11 | 282 | 13.27 | 539 | 25.36 | 610 | 28.71 | 1752 | 82.45 | 373 | 17.55 |
| 28. ඇල්පිටිය | 1246 | 179 | 14.37 | 187 | 15.01 | 383 | 30.74 | 318 | 25.52 | 1067 | 85.63 | 179 | 14.37 |
| 29. අම්බලන්ගොඩ | 1118 | 125 | 11.18 | 135 | 12.08 | 311 | 27.82 | 325 | 29.07 | 896 | 80.14 | 222 | 19.86 |
| 30. උඩුගම | 776 | 122 | 15.72 | 124 | 15.98 | 211 | 27.19 | 215 | 27.71 | 672 | 86.60 | 104 | 13.40 |
| 31. මාතර | 1668 | 333 | 19.96 | 239 | 14.33 | 434 | 26.02 | 427 | 25.60 | 1433 | 85.91 | 235 | 14.09 |
| 32. අකුරැස්ස | 645 | 187 | 28.99 | 100 | 15.50 | 135 | 20.93 | 164 | 25.43 | 586 | 90.85 | 59 | 9.15 |
| 33. මුලටියන-හක්මණ | 746 | 182 | 24.40 | 107 | 14.34 | 193 | 25.87 | 171 | 22.92 | 653 | 87.53 | 93 | 12.47 |
| 34. මොරවක-දෙනියාය | 911 | 156 | 17.12 | 153 | 16.79 | 244 | 26.78 | 256 | 28.10 | 809 | 88.80 | 102 | 11.20 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 1084 | 188 | 17.34 | 163 | 15.04 | 311 | 28.69 | 280 | 25.83 | 942 | 86.90 | 142 | 13.10 |
| 36. හම්බන්තොට | 1972 | 317 | 16.08 | 256 | 12.98 | 628 | 31.85 | 493 | 25.00 | 1694 | 85.90 | 278 | 14.10 |
| 37. වලස්මුල්ල | 1117 | 253 | 22.65 | 230 | 20.59 | 360 | 32.23 | 214 | 19.16 | 1057 | 94.63 | 60 | 5.37 |
| 38. යාපනය | 991 | 24 | 2.42 | 50 | 5.05 | 156 | 15.74 | 304 | 30.68 | 534 | 53.88 | 457 | 46.12 |
| 39. දූපත් | 240 | 4 | 1.67 | 11 | 4.58 | 49 | 20.42 | 89 | 37.08 | 153 | 63.75 | 87 | 36.25 |
| 40. තෙන්මාරච්චි | 414 | 16 | 3.86 | 18 | 4.35 | 75 | 18.12 | 126 | 30.43 | 235 | 56.76 | 179 | 43.24 |
| 41. වලිකාමම් | 1565 | 37 | 2.36 | 51 | 3.26 | 165 | 10.54 | 480 | 30.67 | 733 | 46.84 | 832 | 53.16 |
| 42. වඩමරච්චි | 463 | 13 | 2.81 | 10 | 2.16 | 43 | 9.29 | 150 | 32.40 | 216 | 46.65 | 247 | 53.35 |
| 43. කිලිනොච්චි | 721 | 15 | 2.08 | 24 | 3.33 | 111 | 15.40 | 247 | 34.26 | 397 | 55.06 | 324 | 44.94 |
| 44. මන්නාරම | 323 | 24 | 7.43 | 27 | 8.36 | 83 | 25.70 | 129 | 39.94 | 263 | 81.42 | 60 | 18.58 |
| 45. මඩු | 159 | 4 | 2.52 | 8 | 5.03 | 38 | 23.90 | 74 | 46.54 | 124 | 77.99 | 35 | 22.01 |
| 46. වව්නියාව | 479 | 11 | 2.30 | 28 | 5.85 | 99 | 20.67 | 178 | 37.16 | 316 | 65.97 | 163 | 34.03 |
| 47. වව්නියාව උතුර | 207 | 9 | 4.35 | 16 | 7.73 | 63 | 30.43 | 69 | 33.33 | 157 | 75.85 | 50 | 24.15 |
| 48. මුලතිව් | 394 | 10 | 2.54 | 25 | 6.35 | 89 | 22.59 | 156 | 39.59 | 280 | 71.07 | 114 | 28.93 |
| 49. තුනුක්කායි | 148 | 6 | 4.05 | 8 | 5.41 | 28 | 18.92 | 51 | 34.46 | 93 | 62.84 | 55 | 37.16 |
| 50. මඩකලපුව | 1343 | 54 | 4.02 | 94 | 7.00 | 267 | 19.88 | 416 | 30.98 | 831 | 61.88 | 512 | 38.12 |
| 51. කල්කුඩා | 902 | 23 | 2.55 | 42 | 4.66 | 133 | 14.75 | 329 | 36.47 | 527 | 58.43 | 375 | 41.57 |
| 52. පදිරිප්පු | 949 | 67 | 7.06 | 91 | 9.59 | 244 | 25.71 | 346 | 36.46 | 748 | 78.82 | 201 | 21.18 |
| 53. මඩකලපුව මධ්‍යම | 1003 | 168 | 16.75 | 120 | 11.96 | 277 | 27.62 | 287 | 28.61 | 852 | 84.95 | 151 | 15.05 |
| 54. මඩකලපුව බස්නාහිර | 841 | 25 | 2.97 | 29 | 3.45 | 145 | 17.24 | 284 | 33.77 | 483 | 57.43 | 358 | 42.57 |
| 55. අම්පාර | 1378 | 199 | 14.44 | 182 | 13.21 | 402 | 29.17 | 355 | 25.76 | 1138 | 82.58 | 240 | 17.42 |
| 56. කල්මුනේ | 1777 | 334 | 18.80 | 293 | 16.49 | 524 | 29.49 | 456 | 25.66 | 1607 | 90.43 | 170 | 9.57 |
| 57. සමන්තුරෙයි | 613 | 49 | 7.99 | 83 | 13.54 | 199 | 32.46 | 182 | 29.69 | 513 | 83.69 | 100 | 16.31 |
| 58. මහඔය | 452 | 72 | 15.93 | 50 | 11.06 | 111 | 24.56 | 121 | 26.77 | 354 | 78.32 | 98 | 21.68 |
| 59. දෙහිඅත්තකණ්ඩිය | 455 | 43 | 9.45 | 63 | 13.85 | 134 | 29.45 | 133 | 29.23 | 373 | 81.98 | 82 | 18.02 |
| 60. අක්කරෙයිපත්තුව | 438 | 73 | 16.67 | 71 | 16.21 | 146 | 33.33 | 121 | 27.63 | 411 | 93.84 | 27 | 6.16 |
| 61. තිරුක්කෝවිල් | 443 | 24 | 5.42 | 35 | 7.90 | 107 | 24.15 | 180 | 40.63 | 346 | 78.10 | 97 | 21.90 |
| 62. ත්‍රිකුණාමලය | 172 | 12 | 6.98 | 17 | 9.88 | 38 | 22.09 | 40 | 23.26 | 107 | 62.21 | 65 | 37.79 |
| 63. මුතූර් | 405 | 43 | 10.62 | 51 | 12.59 | 93 | 22.96 | 148 | 36.54 | 335 | 82.72 | 70 | 17.28 |
| 64. කන්තලේ | 357 | 33 | 9.24 | 49 | 13.73 | 84 | 23.53 | 110 | 30.81 | 276 | 77.31 | 81 | 22.69 |
| 65. කින්නියා | 210 | 27 | 12.86 | 18 | 8.57 | 38 | 18.10 | 66 | 31.43 | 149 | 70.95 | 61 | 29.05 |
| 66. ත්‍රිකුණාමලය උතුර | 217 | 29 | 13.36 | 20 | 9.22 | 49 | 22.58 | 62 | 28.57 | 160 | 73.73 | 57 | 26.27 |
| 67. කුරුණෑගල | 1961 | 299 | 15.25 | 229 | 11.68 | 473 | 24.12 | 530 | 27.03 | 1531 | 78.07 | 430 | 21.93 |
| 68. කුලියාපිටිය | 1652 | 299 | 18.10 | 241 | 14.59 | 479 | 29.00 | 416 | 25.18 | 1435 | 86.86 | 217 | 13.14 |
| 69. නිකවැරටිය | 1203 | 256 | 21.28 | 199 | 16.54 | 333 | 27.68 | 281 | 23.36 | 1069 | 88.86 | 134 | 11.14 |
| 70. මහව | 1568 | 284 | 18.11 | 264 | 16.84 | 473 | 30.17 | 356 | 22.70 | 1377 | 87.82 | 191 | 12.18 |
| 71. ගිරිඋල්ල | 1454 | 150 | 10.32 | 173 | 11.90 | 387 | 26.62 | 430 | 29.57 | 1140 | 78.40 | 314 | 21.60 |
| 72. ඉබ්බාගමුව | 1321 | 150 | 11.36 | 139 | 10.52 | 371 | 28.08 | 385 | 29.14 | 1045 | 79.11 | 276 | 20.89 |
| 73. පුත්තලම | 1858 | 270 | 14.53 | 221 | 11.89 | 499 | 26.86 | 534 | 28.74 | 1524 | 82.02 | 334 | 17.98 |
| 74. හලාවත | 1577 | 225 | 14.27 | 175 | 11.10 | 401 | 25.43 | 468 | 29.68 | 1269 | 80.47 | 308 | 19.53 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 75. අනුරාධපුරය | 2115 | 340 | 16.08 | 261 | 12.34 | 564 | 26.67 | 551 | 26.05 | 1716 | 81.13 | 399 | 18.87 |
| 76. තඹුත්තේගම | 1086 | 137 | 12.62 | 136 | 12.52 | 276 | 25.41 | 348 | 32.04 | 897 | 82.60 | 189 | 17.40 |
| 77. කැකිරාව | 1085 | 159 | 14.65 | 127 | 11.71 | 295 | 27.19 | 303 | 27.93 | 884 | 81.47 | 201 | 18.53 |
| 78. ගලෙන්බිඳුණුවැව | 626 | 65 | 10.38 | 74 | 11.82 | 184 | 29.39 | 181 | 28.91 | 504 | 80.51 | 122 | 19.49 |
| 79. කැබිතිගොල්ලෑව | 1008 | 76 | 7.54 | 117 | 11.61 | 288 | 28.57 | 328 | 32.54 | 809 | 80.26 | 199 | 19.74 |
| 80. පොළොන්නරුව | 622 | 81 | 13.02 | 66 | 10.61 | 146 | 23.47 | 204 | 32.80 | 497 | 79.90 | 125 | 20.10 |
| 81. හිඟුරක්ගොඩ | 1064 | 119 | 11.18 | 128 | 12.03 | 287 | 26.97 | 308 | 28.95 | 842 | 79.14 | 222 | 20.86 |
| 82. දිඹුලාගල | 624 | 60 | 9.62 | 86 | 13.78 | 192 | 30.77 | 172 | 27.56 | 510 | 81.73 | 114 | 18.27 |
| 83. බදුල්ල | 1016 | 177 | 17.42 | 121 | 11.91 | 283 | 27.85 | 265 | 26.08 | 846 | 83.27 | 170 | 16.73 |
| 84. බණ්ඩාරවෙල | 890 | 131 | 14.72 | 114 | 12.81 | 226 | 25.39 | 244 | 27.42 | 715 | 80.34 | 175 | 19.66 |
| 85. මහියංගනය | 1127 | 140 | 12.42 | 141 | 12.51 | 297 | 26.35 | 310 | 27.51 | 888 | 78.79 | 239 | 21.21 |
| 86. වැලිමඩ | 795 | 107 | 13.46 | 118 | 14.84 | 216 | 27.17 | 234 | 29.43 | 675 | 84.91 | 120 | 15.09 |
| 87. පස්සර | 617 | 59 | 9.56 | 96 | 15.56 | 178 | 28.85 | 175 | 28.36 | 508 | 82.33 | 109 | 17.67 |
| 88. වියලුව | 517 | 74 | 14.31 | 76 | 14.70 | 133 | 25.73 | 146 | 28.24 | 429 | 82.98 | 88 | 17.02 |
| 89. මොණරාගල | 775 | 96 | 12.39 | 109 | 14.06 | 217 | 28.00 | 208 | 26.84 | 630 | 81.29 | 145 | 18.71 |
| 90. වැල්ලවාය | 1423 | 164 | 11.52 | 181 | 12.72 | 353 | 24.81 | 421 | 29.59 | 1119 | 78.64 | 304 | 21.36 |
| 91. බිබිල | 751 | 117 | 15.58 | 108 | 14.38 | 228 | 30.36 | 185 | 24.63 | 638 | 84.95 | 113 | 15.05 |
| 92. රත්නපුර | 2143 | 390 | 18.20 | 303 | 14.14 | 543 | 25.34 | 509 | 23.75 | 1745 | 81.43 | 398 | 18.57 |
| 93. බලන්ගොඩ | 894 | 135 | 15.10 | 104 | 11.63 | 233 | 26.06 | 258 | 28.86 | 730 | 81.66 | 164 | 18.34 |
| 94. නිවිතිගල | 1040 | 117 | 11.25 | 145 | 13.94 | 306 | 29.42 | 275 | 26.44 | 843 | 81.06 | 197 | 18.94 |
| 95. ඇඹිලිපිටිය | 1364 | 141 | 10.34 | 174 | 12.76 | 415 | 30.43 | 376 | 27.57 | 1106 | 81.09 | 258 | 18.91 |
| 96. කෑගල්ල | 1323 | 202 | 15.27 | 149 | 11.26 | 318 | 24.04 | 377 | 28.50 | 1046 | 79.06 | 277 | 20.94 |
| 97. මාවනැල්ල | 1032 | 129 | 12.50 | 135 | 13.08 | 270 | 26.16 | 261 | 25.29 | 795 | 77.03 | 237 | 22.97 |
| 98. දෙහිඕවිට | 1148 | 112 | 9.76 | 141 | 12.28 | 312 | 27.18 | 340 | 29.62 | 905 | 78.83 | 243 | 21.17 |
| සමස්ත දිවයින | **102461** | **13721** | **13.39** | **12179** | **11.89** | **26020** | **25.40** | **28821** | **28.13** | **80741** | **78.80** | **21720** | **21.20** |

වගුව 4

### 1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 913 | 0.89 | 103023 | 100.00 |
| 81 - 90 | 4432 | 4.30 | 102110 | 99.11 |
| 71 - 80 | 9015 | 8.75 | 97678 | 94.81 |
| 61 - 70 | 12877 | 12.50 | 88663 | 86.06 |
| 51 - 60 | 17746 | 17.23 | 75786 | 73.56 |
| 41 - 50 | 18580 | 18.03 | 58040 | 56.34 |
| 31 - 40 | 18829 | 18.28 | 39460 | 38.30 |
| 21 - 30 | 13258 | 12.87 | 20631 | 20.03 |
| 11 - 20 | 6690 | 6.49 | 7373 | 7.16 |
| 01 - 10 | 679 | 0.66 | 683 | 0.66 |
| 00 - 00 | 4 | 0.00 | 4 | 0.00 |

**වගුව 5**

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : 31 - 40 පන්ති ප්‍රාන්තරය

මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 18829 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 18.28 කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 39460 ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 38.30 කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය** 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි අයදුම්කරුවන් <u>වැඩි ම</u> සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ **2** ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 88%කි. එමෙන් ම අයදුම්කරුවන් <u>අඩු ම</u> සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ **32** ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 17% කි.

* 1, 2, 3, 4 සියලු වරණ සඳහා ලකුණු ලබා දී ඇත. පිළිතුරු සළකුණු කර නැතිනම් ලකුණු හිමි නොවේ.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි 1 ප්‍රශ්නය අනිවාර්ය වුව ද, සුළු පිරිසක් එයට පිළිතුරු සපයා නොමැත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 99% කි. අඩුම ප්‍රතිශතයක් තෝරාගෙන ඇත්තේ 6 ප්‍රශ්නයයි. එම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 29.5%කි.

**ප්‍රස්තාරය** 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින්, 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 12.7%කි. ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 - 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 33.44%කි.

**ප්‍රස්තාරය** 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016**

62 - පුරවැසි අධ්‍යාපනය

**II පත්‍රයේ 1 හා 2 ප්‍රශ්නවල එක් එක් කොටසෙහි පහසුතා දර්ශකය**




**ප්‍රස්තාරය** 4.1 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : 1 ප්‍රශ්නයෙහි (i) කොටසෙහි පහසුතාව 70% ක් වන අතර (vii) කොටසෙහි පහසුතාව 32% කි.

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016**

62 - පුරවැසි අධ්‍යාපනය

**II පත්‍රයේ 3 - 7 ප්‍රශ්නවල එක් එක් කොටසෙහි පහසුතා දර්ශකය**




ප්‍රස්තාරය 4.2

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**මුළු ලකුණු 40 කි.**

- ⋆ වරණ හතරක් සහිත බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3) හා (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තේරීම අපේක්ෂා කෙරේ.
- ⋆ සම්පූර්ණ විෂය නිර්දේශය ම ආවරණය වන පරිදි ප්‍රශ්න සකස් කර ඇත.
- ⋆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.
- ⋆ පළමු හා දෙවන ප්‍රශ්න පත්‍ර එකවර විභාග අපේක්ෂකයාට ලබා දෙන අතර එම ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයීමට ලබා දී ඇති මුළු කාලය පැය තුනකි.

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය

1. අතීතයේ දී සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙන පාලන කටයුතු සිදු කළ රාජ්‍යය වන්නේ,
   (1) බ්‍රිතාන්‍යය ය. (2) ඇතැන්ස් ය. (3) ස්විට්සර්ලන්තය ය. (4) ඉන්දියාව ය.

2. ශ්‍රී ලංකාවේ පුරවැසියකුට ඡන්දය භාවිත කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ වයස් සීමාව වන්නේ,
   (1) වයස අවුරුදු 15 සම්පූර්ණ කර තිබීම ය. (2) වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම ය.
   (3) වයස අවුරුදු 21 සම්පූර්ණ කර තිබීම ය. (4) වයස අවුරුදු 24 සම්පූර්ණ කර තිබීම ය.

3. රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය
   (2) භූමිය, ආණ්ඩුව, ස්වාධිපති බලය, විරුද්ධ පක්ෂය
   (3) ජනගහනය, ස්වාධිපති බලය, අධිකරණය, ආණ්ඩුව
   (4) ජනගහනය, ආණ්ඩුව, ජනාධිපති, විධායක බලය

4. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු යුතුකම් වර්ග දෙක වන්නේ,
   (1) සිවිල් හා දේශපාලන යුතුකම් ය. (2) සංස්කෘතික හා ආගමික යුතුකම් ය.
   (3) ආර්ථික හා සමාජයීය යුතුකම් ය. (4) නීතිමය හා සදාචාරාත්මක යුතුකම් ය.

5. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පාලන කටයුතු පවත්වාගෙන යාමේ ජනතාව සතු බලය හඳුන්වන්නේ,
   (1) ඡන්ද බලය යනුවෙනි. (2) උත්තරීතර බලය යනුවෙනි.
   (3) පරමාධිපත්‍ය බලය යනුවෙනි. (4) ව්‍යවස්ථාදායක බලය යනුවෙනි.

6. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,
   (1) බලය විමධ්‍යගත කිරීමයි. (2) බලය බෙදීමයි.
   (3) බලය පවරා දීමයි. (4) බලය නියාමනය කිරීමයි.

7. සන්ධීය රාජ්‍යයක බලය බෙදාහැරීම සිදු වන්නේ,
   (1) ජනාධිපති හා මධ්‍යම ආණ්ඩුව අතර ය.
   (2) ජනාධිපති හා ප්‍රාන්ත ආණ්ඩු අතර ය.
   (3) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුකාරවරයා අතර ය.
   (4) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර ය.

8. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක මහ ඇමතිවරයා ද ඇතුළු ව අමාත්‍ය මණ්ඩලය
   (1) හතරදෙනකුගෙන් සමන්විත ය. (2) පස්දෙනකුගෙන් සමන්විත ය.
   (3) හයදෙනකුගෙන් සමන්විත ය. (4) හත්දෙනකුගෙන් සමන්විත ය.

9. ස්විට්සර්ලන්තයේ දේශපාලන ව්‍යුහය තුළ බලතල ක්‍රියාවට නැංවීමේ දී ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් එය විසඳීමේ බලය ඇත්තේ,
   (1) ජාතික සභාවට ය. (2) කැන්ටන් අධිකරණයට ය.
   (3) සන්ධීය මහා මණ්ඩලයට ය. (4) විධායක මහා සභාවට ය.

10. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වැදගත් ප්‍රතිඵලයකි,
    (1) එකිනෙකාට ගරු කිරීමට පුරුදු වීම.
    (2) රාජ්‍ය භාෂා කිහිපයක් භාවිත කළ හැකි වීම.
    (3) විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.
    (4) ජන වර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වීම.

11. මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීමට යාමේ දී ගැටලු මතුවීමට ප්‍රධාන හේතුවක් වන්නේ,
    (1) අවශ්‍යතා පිරිමසා ගැනීමට අවශ්‍ය සම්පත් සීමිත වීමයි.
    (2) පුද්ගලයාගෙන් පුද්ගලයාට අවශ්‍යතා වෙනස් වීමයි.
    (3) අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය දැනුම ප්‍රමාණවත් නොවීමයි.
    (4) අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීමයි.

12. ආර්ථික නොවන භාණ්ඩයක් හා ආර්ථික භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
    (1) ජලය හා ආහාර (2) ජලය හා වාතය
    (3) ඖෂධ හා හිරු එළිය (4) ඇඳුම් හා ආහාර

13. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලිය අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) නිෂ්පාදනය, පරිභෝජනය, බෙදාහැරීම (2) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය
    (3) නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදාහැරීම (4) නිෂ්පාදනය, ගබඩා කිරීම, පරිභෝජනය

14. පුද්ගලයා තුළ, පුද්ගලයන් අතර, පවුල තුළ, පවුල් අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,
    (1) සාර්ව ගැටුම් ලෙස ය. (2) පවුල් ගැටුම් ලෙස ය.
    (3) සූක්ෂ්ම ගැටුම් ලෙස ය. (4) පුද්ගල ගැටුම් ලෙස ය.

15. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියකු විසින් වර්ධනය කරගත යුතු පුද්ගල ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) අන් අයට ගරු කිරීම, අන්මත ගරු කිරීම, සාධාරණත්වය
   (2) දරා ගැනීමේ ශක්තිය, පරිත්‍යාගශීලී බව, සහානුභූතිය
   (3) ඵලදායී සන්නිවේදනය, නිර්මාණාත්මක චින්තනය, සවන් දීම
   (4) ආත්මාවබෝධය, ඉවසීම, දරාගැනීමේ ශක්තිය

16. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,
   (1) ජනතාවගේ ආරක්ෂාව සහතික වන ආකාරයට පාලනය මෙහෙයවීමට මග පෙන්වීම ය.
   (2) ජනතාවගේ ජීවිත, දේපළ හා අයිතිවාසිකම් රැකෙන සේ මානව හැසිරීම් පාලනය කිරීම ය.
   (3) ජනතාව තුළ නීතිය පිළිබඳ දැනුම තහවුරු කිරීම ය.
   (4) සමාජයේ වැරදි කරන පුද්ගලයන් සියලු දෙනා අධිකරණය හමුවට පැමිණවීම ය.

17. ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළ ම අභියාචනා අධිකරණය ලෙස ක්‍රියාත්මක වන්නේ,
   (1) මහාධිකරණයයි. (2) අභියාචනාධිකරණයයි.
   (3) ශ්‍රේෂ්ඨාධිකරණයයි. (4) යුද්ධාධිකරණයයි.

18. මිනීමැරුම් හා සම්බන්ධ නඩු විභාග කිරීමේ බලය ඇති අධිකරණය වන්නේ,
   (1) අභියාචනාධිකරණයයි. (2) පළාත්බද මහාධිකරණයයි.
   (3) දිසා අධිකරණයයි. (4) මහාධිකරණයයි.

19. මරණ දඬුවම නියම වූවකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශය ජනාධිපතිවරයාට ලබාදීම සිදු කරන්නේ,
   (1) නීතිපතිතුමා විසිනි. (2) අග්‍රවිනිශ්චයකාරතුමා විසිනි.
   (3) සොලිසිටර් ජනරාල්තුමා විසිනි. (4) අධිකරණ ඇමතිතුමා විසිනි.

20. 1931 දී සිදු කරන ලද ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ පිහිටුවනු ලැබූ ආයතනය මින් කුමක් ද?
   (1) ව්‍යවස්ථාදායක සභාව (2) රාජ්‍ය මන්ත්‍රණ සභාව
   (3) ජාතික රාජ්‍ය සභාව (4) පාර්ලිමේන්තුව

21. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදු කරන ලද ප්‍රධානතම වෙනස්කම වන්නේ,
   (1) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීමයි. (2) ජනමත විචාරණ ක්‍රමය හඳුන්වා දීමයි.
   (3) විධායක ජනාධිපති ධුරය ඇති කිරීමයි. (4) පළාත් සභා ක්‍රමය හඳුන්වා දීමයි.

22. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි වන්නේ,
   (1) පාර්ලිමේන්තුව පත්වී අවම වශයෙන් වසරක කාලයක් අවසන් වූ පසුව ය.
   (2) පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතු යැයි අගමැතිවරයා ඉල්ලා සිටි විටක ය.
   (3) ජනාධිපතිවරයාට අභිමත පරිදි ඕනෑම අවස්ථාවක දී ය.
   (4) පාර්ලිමේන්තුව පත් වී අවම වශයෙන් වසර හතරහමාරක් ගත වූ පසුව ය.

23. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්ය අතුරෙන් පොදු උපයෝගිතා සේවාවලට අයත් **නොවන** කාර්යයක් වන්නේ,
   (1) පොදු ස්ථානවලට විදුලිය ලබා දීම ය. (2) මහජන වෙළෙඳපොළ පවත්වාගෙන යාම ය.
   (3) මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තු කිරීම ය. (4) පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම ය.

24. මිනිසාගේ මැදිහත් වීමෙන් ගොඩනැගී ඇති ආගම්, කුල, උරුම, සිරිත් විරිත්, අයිතිවාසිකම්, යුතුකම්, නෛතික සම්ප්‍රදායන් ආදී අංශ ඇතුළත් පරිසරය හඳුන්වන්නේ පහත සඳහන් කවර නමකින් ද?
   (1) සමාජ පරිසරය (2) ස්වාභාවික පරිසරය
   (3) ජෛව පරිසරය (4) මානව පරිසරය

25. A - පරිගණක සාක්ෂරතාව
   B - මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
   C - හරිත දළ දේශීය නිෂ්පාදිතය
   D - ආර්ථික වර්ධන වේගය
   E - භෞතික ජීවන තත්ත්ව දර්ශකය

සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන ඉහත දක්වා ඇති මිනුම් අතුරෙන් සාම්ප්‍රදායික මිනුම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) A හා B (2) B හා C (3) B හා D (4) D හා E

26. පරිසරය සම්බන්ධ පුරවැසි වගකීමක් වන්නේ,
   (1) සංවර්ධන කටයුතුවල දී පරිසර පිරිවැය තක්සේරු කිරීම ය.
   (2) දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පරිසර හිතකාමී පුරවැසියන් බිහි කිරීම ය.
   (3) සැමවිට ම පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම ය.
   (4) පරිසරය හා සම්බන්ධ නීති රාමුවට අනුකූල ව කටයුතු කිරීමට පුරවැසි ආකල්ප සංවර්ධනය කිරීම ය.

**27.** සංවර්ධිත රටවල ලක්ෂණ දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නාගරික ජන සංඛ්‍යාව අඩු අතර ළදරු මරණ අනුපාතය ද අඩු ය.
(2) ආයු අපේක්ෂාව ඉහළ මට්ටමක පවතින අතර, ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩි ය.
(3) භෞතික ජීවන තත්ත්ව දර්ශකය ඉහළ වන අතර, විදේශ විනිමය ඉපැයීම අඩු ය.
(4) මානව සංවර්ධන දර්ශකය ඉහළ අගයක් ගන්නා අතර, ජන සංඛ්‍යා වර්ධන වේගය අඩු ය.

**28.** ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවන් මගින් මූලික අයිතිවාසිකම් කඩවීමක දී ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කොට සාධාරණ විනිශ්චයක් ලබා ගැනීමට ඕනෑම පුද්ගලයකුට හැකි ය.
(2) මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කර උචිත නිර්දේශ ලබාදීමේ බලය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සතු ය.
(3) ඕනෑම පුද්ගලයකුට මානව හිමිකම් කඩවීම සම්බන්ධ නඩු කටයුත්තක තීන්දුවක් පිළිබඳ සෑහීමට පත් නොවේ නම්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත පැමිණිලි කළ හැකි ය.
(4) රජයේ හෝ පළාත් පාලන ආයතන නිලධාරියකු විසින් කරන ලද මානව හිමිකම් කඩ කිරීමක් සම්බන්ධ පැමිණිලි විභාග කොට වැරදිකරුවන්ට දඬුවම් කිරීමේ බලය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) සතු ය.

**29.** තිරසාර සංවර්ධනය සම්බන්ධ පුරවැසි යුතුකමක් ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?
(1) අධි පරිභෝජනයෙන් වැළකීම
(2) පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිෂ්පාදකයින් දිරිගැන්වීම
(3) පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම
(4) පාරිසරික බලපෑම් තක්සේරු කිරීම

**30.** යම් රටක විදේශීය ශුද්ධ සාධක ආදායම සැලකිල්ලට ගැනීමෙන් පසුව වර්ෂයක් තුළ නිපදවන සියලු භාණ්ඩ හා සේවාවල වටිනාකම්වල එකතුව හඳුන්වන නම කුමක් ද?
(1) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
(2) මූල්‍ය දළ ජාතික නිෂ්පාදිතය
(3) දළ ජාතික නිෂ්පාදිතය
(4) හරිත දළ දේශීය නිෂ්පාදිතය

**31.** භෞතික පරිසරයට හානි සිදුවන ස්වාභාවික සංසිද්ධි දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) කාන්තාරීකරණය, ලවණීකරණය
(2) සුළි කුණාටු, සුනාමි
(3) හිම දියවීම, සාගර ජල මට්ටම ඉහළ යාම
(4) ගෝලීය උණුසුම් වීම, අම්ල වැසි ඇති වීම

**32.** පරිසර විනාශයට ප්‍රධාන හේතුවක් ලෙස සැලකිය හැකි කරුණ වන්නේ ජනතාවගේ,
(1) දිළිඳුකම ය. (2) අඩු අධ්‍යාපනය ය. (3) නොදැනුවත්කම ය. (4) වැරදි ආකල්ප ය.

**33.** අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතට ඇතුළත් වන ප්‍රධාන නීතිමය ලේඛන සංඛ්‍යාව,
(1) 6 කි. (2) 5 කි. (3) 4 කි. (4) 3 කි.

**34.** යුදමය අරමුණු මත පිහිටුවා ගන්නා ලද කලාපීය සංවිධානයක් වන්නේ කුමක් ද?
(1) ආසියාන් (ASEAN) (2) නේටෝ (NATO) (3) සාර්ක් (SAARC) (4) බිම්ස්ටෙක් (BIMSTEC)

**35.** කිසියම් රටක් රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී බලපාන වැදගත්ම සාධකය වන්නේ එම රටෙහි,
(1) භූගෝලීය පිහිටීමයි.
(2) දේශපාලන ස්ථාවරභාවයයි.
(3) විදේශ ප්‍රතිපත්තියයි.
(4) ආර්ථික ප්‍රතිපත්තියයි.

**36.** ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූපය දෙස බලන කල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) ජාත්‍යන්තර ත්‍රස්තවාදයට අනුබල දීම ය.
(2) බහු ජාතික සමාගම් දුබල රාජ්‍යවල සම්පත් සූරාකෑම ය.
(3) ප්‍රබල රාජ්‍ය සිය බල කඳවුරු ශක්තිමත් කර ගැනීමට උත්සාහ දැරීම ය.
(4) ප්‍රබල රාජ්‍ය දුබල රාජ්‍ය වෙත විවිධාකාර බලපෑම් කරනු ලැබීම ය.

**37.** සප්තා (SAPTA) සහ සෆ්තා (SAFTA) වෙළෙඳ ගිවිසුම් ඇති කර ගන්නා ලද්දේ පහත සඳහන් කවර සංවිධානයක සාමාජික රටවල් අතර ද?
(1) ආසියාන් (2) බිම්ස්ටෙක් (3) යුරෝපා සංගමය (4) සාර්ක්

**38.** සංවර්ධිත රටවල් මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද පොදුවේ මුහුණ දෙන ගැටලුවකි,
(1) අවාසිදායක වෙළෙඳ ශේෂයක් පැවතීම.
(2) දේශපාලන අස්ථාවරත්වයක් තිබීම.
(3) ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ බලපෑම.
(4) දේශීය සම්පත් හිමිකම විදේශිකයන් සතු වීම.

**39.** රාජ්‍ය අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යන ප්‍රධාන මාධ්‍යය වන්නේ,
(1) තානාපති සේවයයි.
(2) ආරක්ෂක අමාත්‍යාංශයයි.
(3) ජනාධිපති කාර්යාලයයි.
(4) විදේශ කටයුතු අමාත්‍යාංශයයි.

**40.** පහත **I තීරුවේ** එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන තුනක් හා **II තීරුවෙහි** ඒවාට අදාළ බලතල හා කාර්ය කිහිපයක් ද දක්වා ඇත.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| 1 - මහා මණ්ඩලය | A - එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා පාලනය කිරීම |
| 2 - ආරක්ෂක මණ්ඩලය | B - අවි පාලනය සඳහා සැලසුම් සම්පාදනය |
| 3 - ලේකම් කාර්යාලය | C - නිරායුධකරණය හා අවි සීමා කිරීමේ ප්‍රතිපත්ති විමර්ශනය කිරීම හා නිර්දේශ කිරීම |
| | D - මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීම |

**I තීරුවේ** අනුපිළිවෙළට ගැළපෙන සේ **II තීරුව** සකස් කළ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A, B, C (2) B, A, D (3) C, B, A (4) D, C, B

❋ ❋

**2.1.3** I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 3 |
| 02. | 2 | 22. | 4 |
| 03. | 1 | 23. | 3 |
| 04. | 4 | 24. | 1 |
| 05. | 3 | 25. | 3 |
| 06. | 1 | 26. | 3 |
| 07. | 4 | 27. | 4 |
| 08. | 2 | 28. | 4 |
| 09. | 3 | 29. | 1 |
| 10. | 4 | 30. | 3 |
| 11. | 1 | 31. | 2 |
| 12. | 1 | 32. | 1 |
| 13. | 2 | 33. | 1 |
| 14. | 3 | 34. | 2 |
| 15. | 4 | 35. | 3 |
| 16. | 2 | 36. | 4 |
| 17. | 3 | 37. | 4 |
| 18. | 1, 2, 3, 4 | 38. | 3 |
| 19. | 1 | 39. | 1 |
| 20. | 2 | 40. | 3 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.**

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (විෂය ක්ෂේත්‍රය අනුව) :




1 පත්‍රයේ 1, 2, 3, 12 හා 17 ප්‍රශ්න සඳහා පිළිවෙළින් 77% ක්, 88% ක්, 80% ක්, 73% ක් හා 75% ලෙස අයදුම්කරුවන්ගෙන් 75%කට වැඩි ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. එසේම එහි 9, 14, 23, 27, 32 හා 40 යන ප්‍රශ්න සඳහා පිළිවෙලින් 24% ක්, 20% ක්, 24%, 20%, 17%, හා 22% ක් ලෙස පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් 24% ක් හෝ ඊට අඩු ප්‍රතිශතයකි.

- පහසුතාව වැඩිම ප්‍රශ්නය 2 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 88% කි.
- පහසුතාව අඩුම ප්‍රශ්නය 32 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 17% කි.

* 1, 2, 3, 4 වරණ හතරට ම ලකුණු ලබා දී ඇත. පිළිතුරු සළකුණු කර නැතිනම් ලකුණු හිමි නොවේ.

## 2.1.5 I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | ප්‍රතිචාර නො දැක් වූ |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | |
| 1 | 2 | 11.7% | 77.2% | 7.7% | 3.3% | 0.1% |
| 2 | 2 | 1.00% | 88.1% | 9.9% | 1.0% | - |
| 3 | 1 | 80.4% | 2.7% | 8.9% | 7.9% | 0.1% |
| 4 | 4 | 7.7% | 10.9% | 12.3% | 68.9% | 0.2% |
| 5 | 3 | 32.5% | 8.3% | 54.5% | 4.3% | 0.4% |
| 6 | 1 | 67.8% | 19.1% | 10.5% | 2.3% | 0.3% |
| 7 | 4 | 16.7% | 12.3% | 10.9% | 59.8% | 0.3% |
| 8 | 2 | 23.3% | 38.4% | 24.3% | 13.6% | 0.4% |
| 9 | 3 | 9.9% | 54.4% | 24.4% | 11.0% | 0.3% |
| 10 | 4 | 21.1% | 7.0% | 13.5% | 58.0% | 0.4% |
| 11 | 1 | 33.9% | 41.6% | 6.3% | 18.1% | 0.1% |
| 12 | 1 | 72.7% | 8.8% | 11.3% | 7.1% | 0.1% |
| 13 | 2 | 9.3% | 68.9% | 16.9% | 4.7% | 0.2% |
| 14 | 3 | 23.2% | 11.2% | 20.4% | 45.2% | - |
| 15 | 4 | 35.9% | 6.2% | 19.7% | 37.9% | 0.3% |
| 16 | 2 | 16.0% | 64.5% | 9.1% | 10.3% | 0.1% |
| 17 | 3 | 14.3% | 7.8% | 75.1% | 2.7% | 0.1% |
| 18 | 1, 2, 3, 4 | 19.8% | 9.6% | 14.2% | 56.2% | 0.2% |
| 19 | 1 | 48.9% | 26.9% | 12.2% | 11.9% | 0.2% |
| 20 | 2 | 15.9% | 53.3% | 18.5% | 12.0% | 0.3% |
| 21 | 3 | 16.9% | 18.0% | 51.5% | 13.5% | 0.3% |
| 22 | 4 | 25.4% | 16.3% | 25.1% | 33.0% | 0.2% |
| 23 | 3 | 16.5% | 33.3% | 24.1% | 25.8% | 0.3% |
| 24 | 1 | 66.8% | 4.7% | 5.6% | 22.7% | 0.2% |
| 25 | 3 | 3.5% | 38.9% | 32.3% | 25.1% | 0.2% |
| 26 | 3 | 3.5% | 9.0% | 62.0% | 25.4% | 0.1% |
| 27 | 4 | 12.2% | 51.3% | 16.7% | 19.5% | 0.3% |
| 28 | 4 | 21.5% | 14.0% | 25.3% | 38.7% | 0.5% |
| 29 | 1 | 40.1% | 46.1% | 6.8% | 6.7% | 0.3% |
| 30 | 3 | 19.3% | 29.1% | 46.4% | 4.9% | 0.3% |
| 31 | 2 | 7.3% | 57.8% | 8.1% | 26.6% | 0.2% |
| 32 | 1 | 16.9% | 9.9% | 27.2% | 45.7% | 0.3% |
| 33 | 1 | 32.3% | 26.7% | 20.5% | 20.1% | 0.4% |
| 34 | 2 | 10.8% | 52.1% | 25.2% | 11.7% | 0.2% |
| 35 | 3 | 14.6% | 33.3% | 28.6% | 23.4% | 0.1% |
| 36 | 4 | 8.9% | 17.9% | 27.6% | 45.5% | 0.1% |
| 37 | 4 | 20.6% | 15.0% | 26.7% | 37.7% | - |
| 38 | 3 | 19.2% | 21.4% | 41.9% | 17.3% | 0.2% |
| 39 | 1 | 47.9% | 15.0% | 11.5% | 25.6% | - |
| 40 | 3 | 12.9% | 27.2% | 22.1% | 37.5% | 0.3% |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

## 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

I ප්‍රශ්න පත්‍රයේ පහසුතාව 60% ඉක්මවූ ප්‍රශ්න සංඛ්‍යාව 12 කි. මෙම ප්‍රශ්න අතරින් ප්‍රශ්න අංක 2, 3, 17 ප්‍රශ්නවල පහසුතාව 75% ඉක්මවා ඇත. ඒ අතරින් ඉහළ ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ 2 හා 3 ප්‍රශ්නයි. මෙම පහසුතාවට බලපා ඇත්තේ මෙම ප්‍රශ්න සඳහා යොදා ගෙන ඇති කරුණු ප්‍රායෝගික ලෝකය තුළ නිතර අසන්නට ලැබීමත්, පෙළ පොතෙහි එම කරුණු සුවිශේෂීව දක්වා තිබීමත් ය.

මෙහි අඩු ම පහසුතාවක් පෙන්වා ඇත්තේ 32 වන ප්‍රශ්නයයි. එයින් විමසා ඇත්තේ පරිසර විනාශය පිළිබඳ දැනුමයි. ඒ සඳහා නිවැරදි පිළිතුරු තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය 17% කි. මෙම ප්‍රශ්නයට සපයා ඇති වරණ අතරින් වැඩි ප්‍රතිශතයක් හතරවන වරණයට හිමි වී ඇත. පරිසරය පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොමැති වීම මෙයට හේතු වී ඇතැයි සැළකිය හැකි ය. සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා පෙළ පොත පරිහරණය ජනප්‍රිය කරවීම, පෙරහුරු අභ්‍යාස කරවීම මෙන් ම බාහිර මාධ්‍යයන්ගෙන් දැනුම තහවුරුකර ගැනීමට ද, සිසුන් පෙළඹවිය යුතු බවට යේජනා කළ හැකි ය.

I ප්‍රශ්න පත්‍රයේ 9, 11, 14, 22, 23, 25, 27, 35, 40 යන ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 25%, 34%, 20%, 33%, 24%, 33%, 19%, 29% සහ 22%ක් වේ. මෙසේ පහසුතාව අඩු වීමට විවිධ කරුණු බලපා ඇති අතර පහත දැක්වෙන හේතූන් සුවිශේෂී වේ. ඒ අතරින් සමහර ප්‍රශ්න සඳහා ඉදිරිපත් කර ඇති සංකල්ප සිසුන්ට දුරස්ථ බවක් පෙන්නුම් කිරීමත්, දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර සුවිශේෂීව හඳුනා ගැනීම කෙරෙහි සිසුන් දැක්වූ දුබලතාවයත්, අඛණ්ඩව අභ්‍යාසවලට යොමු නොවීමත් ලෙස පෙන්වා දිය හැකි ය.

සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා එදිනෙදා තොරතුරු පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කිරීමත්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර සඳහා මෙවැනි ප්‍රශ්න ද, ඇතුළත් කර අභ්‍යාස කරවීමත්, සුදුසු බවට යොජනා කළ හැකි ය.

ප්‍රශ්න අංක 25, 27 සඳහා යොදා තිබූ සිසුන්ට ආගන්තුක වූ "සංවර්ධනය" පිළිබඳ සංකල්ප වඩාත් තහවුරු වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු ය.

කරුණු මතක තබා ගැනීමේ දුර්වලතා, සුවිශේෂී කරුණු පිළිබඳ අවධානය යොමු නොකිරීම, නිවැරදිව ප්‍රශ්න තේරුම් නොගැනීම, සංකල්ප හා වචනාර්ථ පිළිබඳ දැනුම අල්ප වීම වැනි දුර්වලතා මග හරවා ගැනීමට සිසුන් යොමු කිරීමෙන් ඉහළ සාධන මට්ටමක් අපේක්ෂා කළ හැකි ය.

වැදගත් සංකල්ප ලේඛනගත කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම සහ දෛනිකව කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇසුරින් ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් විෂය කරුණු තව දුරටත් තහවුරු කර ගැනීමට අවස්ථා සලසා දීමෙන් පළමු පත්‍රයේ විෂය සාධන මට්ටම ඉහළ නංවා ගත හැකි ය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II පත්‍රය - I පත්‍රය හා II පත්‍රය සඳහා සම්පූර්ණ කාලය පැය තුනකි. II පත්‍රය සඳහා මුළු ලකුණු 60කි. පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි. සෙසු ව්‍යුහගත ප්‍රශ්න 6න් 4කට පිළිතුරු සැපයිය යුතුයි. එක් පිළිතුරකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40කි.

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණ | = | 100 |

### 2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න තෝරා ඇති ආකාරය හා ප්‍රශ්නවල පහසුතාව



**2.2.3 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

⋆ **II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ගැනීම හා ලකුණු ලබා ගත් ආකාරය.**

| | |
|---|---|
| (01) අපේක්ෂණය : | බහු සංස්කෘතික සමාජය, යුක්තිය හා නීතිය, රාජ්‍යය, ආර්ථික ක්‍රම, මානව අයිතිවාසිකම්, යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම. |

## A කොටස - ව්‍යුහගත රචනා

1 ප්‍රශ්නය

**1.** (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව නිර්වචන ඉදිරිපත් කළ ප්‍රකට පුද්ගලයන් **දෙදෙනකු** නම් කරන්න.

(ii) රාජ්‍යයකට පැවරෙන කාර්ය **දෙකක්** ලියන්න.

(iii) ඒකීය රාජ්‍යයක ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(iv) යහපාලනයක මූලික අංග **දෙකක්** නම් කරන්න.

(v) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම **දෙක** නම් කරන්න.

(vi) ජෝන් ගැල්ටුංගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියෙහි දැක්වෙන, ගැටුම් ඇතිවීමට බලපාන මූලික හේතු තුනෙන් **දෙකක්** නම් කරන්න.

(vii) මහේස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කළ හැකි නඩු වර්ග **දෙකක්** නම් කරන්න.

(viii) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව) සතු බලතල හා කාර්ය **දෙකක්** සඳහන් කරන්න.

(ix) ශ්‍රී ලංකා රජය කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති පියවර **දෙකක්** සඳහන් කරන්න.

(x) සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇති වන ප්‍රතිඵල **දෙකක්** නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

1 (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කළ ප්‍රකට පුද්ගලයන්

- ★ ඒබ්‍රහම් ලින්කන්
- ★ සීලර්
- ★ ජේ. ආර්. ලවල්

**මින් දෙකක් නම් කිරීමට - ලකුණු 02**

(ii) රාජ්‍යයකට පැවරෙන කාර්යයන්

- ★ නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- ★ ආර්ථික හා දේශපාලන ස්ථාවරභාවය පවත්වාගෙන යාම
- ★ සමාජ සුබසාධක සේවා සැපයීම
- ★ දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කිරීම
- ★ පොදු සේවා පවත්වාගෙන යාම
- ★ සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක කිරීම
- ★ යුධ කැරලි කෝලහල වාර්ගික අර්බුද වැනි ගැටුම් විසඳීම
- ★ මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

**මෙවැනි කාර්යයන් දෙකක් සඳහන් කිරීමට - ලකුණු 02**

(iii) ඒකීය රාජ්‍යයක ලක්ෂණ

- ★ ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නැංවීම.
- ★ මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන කටයුතු පහසුකර ගැනීමේ අරමුණ සහිතව එකී පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත විමධ්‍යගත කර තිබීම.
- ★ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන ලද පනතක් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම.
- ★ මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක විමධ්‍යගත කරන ලද එම පරිපාලන බලතල නැවත පවරාගත හැකි වීම.
- ★ මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය
- ★ අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩුක්‍රමය තුළ නොමැති වීම.

**මේවායින් දෙකක් නම් කිරීමට - ලකුණු 02**

(iv) යහ පාලනයක මූලික අංග

- ★ දූෂණයෙන්, වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය
- ★ නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම
- ★ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම හා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම
- ★ රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නංවන පුද්ගලයින් ජනතාවට වගකීමට බැඳී සිටීම.
- ★ අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
- ★ මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම
- ★ සම්පත් කාර්යක්ෂම හා ප්‍රතිඵලදායී අයුරින් භාවිත කිරීම
- ★ විනිවිද භාවයකින් කටයුතු කිරීම
- ★ ගුණාත්මක දේශපාලන සමාජානුයෝජනයට අවශ්‍ය පසුබිම සකස් කිරීම
- ★ ව්‍යවස්ථානුකූලභාවය ආරක්ෂා කිරීම හා රැකගැනීම

**මෙවැනි දෙකක් සඳහන් කිරීමට - ලකුණු 02**

(v) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම

- ★ ප්‍රාග්ධන සූක්ෂම
- ★ ශ්‍රම සූක්ෂම

**මෙම ශිල්පීය ක්‍රම දෙක නම් කිරීමට - ලකුණු 02**

(vi) ගැල්ටුංගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ ගැටුම් ඇතිවීමට බලපාන මූලික හේතු

- ★ චර්යාව
- ★ සංදර්භය
- ★ ආකල්ප

**මින් දෙකක් නම් කිරීමට - ලකුණු 02**

(vii) මහේස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කළ හැකි නඩු වර්ග දෙකක්

- ★ මහජන ආරක්ෂාව සම්බන්ධ වැරදි
- ★ යුද, ගුවන්, නාවික හමුදා සම්බන්ධ වැරදි
- ★ රජයේ සේවකයන් සම්බන්ධ වැරදි
- ★ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා අදාළ ආරක්ෂක ආඥා සඳහා වන ඉල්ලීම්.
- ★ මැතිවරණ සම්බන්ධ වැරදි.
- ★ බොරු සාක්ෂි දීම හා මහජන යුක්තියට එරෙහි වැරදි
- ★ පාර්ලිමේන්තු පනත් මගින් දක්වා ඇති වැරදි
  (කෑලෑ පනත, සුරාබදු පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, ආහාර පනත, මාර්ග සංවර්ධන අධිකාරී පනත, මෝටර් රථ ප්‍රවාහන පනත, පාංශු සංරක්ෂණ පනත ආදී ......)

**මෙවැනි දෙකක් සඳහන් කිරීමට - ලකුණු 02**

(viii) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව සතු බලතල හා කාර්ය

- ★ නීති සම්පාදනය කිරීම
- ★ නීති සම්මත කිරීම/ නීති පැනවීම
- ★ විධායකය පාලනය කිරීම
- ★ අයවැය පාලනය/ මූල්‍ය පාලනය
- ★ ප්‍රශ්න ඇසීම
- ★ විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම
- ★ මහජන දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම
- ★ ආණ්ඩුව ගනු ලබන ක්‍රියාමාර්ග සාධාරණව විවේචනය කිරීම
- ★ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට දායක වීම
- ★ දෝෂාභියෝග ඉදිරිපත් කිරීම
- ★ විශ්වාසභංග යෝජනා ඉදිපත් කිරීම
- ★ අනාගත පාලකයින් පුහුණු කිරීම

**මෙවැනි කරුණු දෙකක් සඳහන් කිරීමට - ලකුණු 02**

(ix) ශ්‍රී ලංකා රජය කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති පියවර

- ★ සිඩෝ සම්මුතියට අනුව 1993 දී ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම
- ★ කාන්තා කටයුතු සම්බන්ධ වෙන ම අමාත්‍යංශයක් පිහිටුවීම.
- ★ කාන්තාවන්ට සිදුවන අසාධාරණකම් සොයා බැලීම සඳහා ජාතික කාන්තා කමිටුව පිහිටුවීම
- ★ ගැහැණු ළමයින්ට හා කාන්තාවන්ට එරෙහිව සිදුකරන වැරදි දණ්ඩනීති සංග්‍රහයට ඇතුළත් කිරීම.
- ★ ගැහැණු ළමයින්ට හා කාන්තාවන්ට ද රැකවරණය සැලසෙන පරිදි ඔවුන්ට එරෙහිව නිවස තුළ දී සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත සම්මත කිරීම.
- ★ සැම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටුවීම.

**මෙවැනි පියවර දෙකක් සඳහන් කිරීම - ලකුණු 02**

(x) සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල

- ★ සමාජ සබඳතා බිඳවැටීම.
- ★ ආගමික හා වාර්ගික ගැටුම් ඇතිවීම.
- ★ සමාජ අසාධාරණකම් සිදුවීම.
- ★ පවුල් සංස්ථා බිඳවැටීම.
- ★ දෙමාපිය දූදරු සබඳතා බිඳවැටීම
- ★ සමාජ දුරාචාර වැඩිවීම.
- ★ සමාජ විරෝධී ක්‍රියා වැඩිවීම.

**මෙවැනි ප්‍රතිඵල දෙකක් සඳහන් කිරීමට - ලකුණු 02**

**1 ප්‍රශ්නය ලකුණු 02 x 10 - ලකුණු 20**

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




1 ප්‍රශ්නය අනිවාර්යය වුවත් පිළිතුරු සපයා ඇත්තේ 99% ක ප්‍රතිශතයක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ.

ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 34% ක්
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31% ක්
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 22 % ක් හා
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 13% ක්

ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වඩා ලබාගත් පිරිස 13%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 34% ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5 හෝ ඊට අඩුවෙනි.




මෙම පළමු ප්‍රශ්නය කොටස් 10 කින් සමන්විත වේ. ඒ අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වේ. එහි පහසුතාව 70%කි. එසේ ම පහසුතාව අඩු ම කොටස වන්නේ (vii) ය. එහි පහසුතාව 32%කි.

පළමු ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 කි. ඉන් ලකුණු 16 - 20 ත් අතර ලබා ගත් ප්‍රතිශතය 13% කි. ලකුණු 0 - 05 ත් අතර ලබා ගත් ප්‍රතිශතය 34% කි.

පළමු ප්‍රශ්නයේ (i) කොටස සඳහා ඉහළම පහසුතාව 70% කි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සිසුන් තුළ මනා අවබෝධයක් පැවතීම මෙම පහසුතාවයට හේතු වී ඇත.

ප්‍රශ්නයේ මධ්‍යස්ථ සාර්ථක භාවයක් පෙන්වා ඇති කොටස් වනුයේ (ii), (iv), (vi) හා (viii) ය. මෙම ප්‍රශ්න සඳහා රාජ්‍යයකට පැවරෙන කාර්යයන්, යහ පාලනය, ගැටුම් නිරාකරණය, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තු බලතල යන ඒකක යොදා ගෙන ඇත. මෙම ඒකක පිළිබඳව සිසුන්ගේ අවබෝධය සාර්ථක මට්ටමක ඇති බව මින් පැහැදිලි වේ.

අඩු පහසුතාවක් පෙන්වූ කොටස් වනුයේ (iii), (vii) සහ (ix) යි. ඒ සඳහා පිළිවෙලින් 33%, 32%, 32% ලෙස ප්‍රතිශත ලබා ඇත. එම ඒකක වන රාජ්‍යයක ලක්‍ෂණ, නීතිය, මානව අයිතිවාසිකම්, පිළිබඳ නිශ්චිත හා පැහැදිලි අවබෝධයක් නොමැති වීම පහළ පහසුතාවක් ලබා ගැනීමට ප්‍රධාන හේතු වී ඇත.

මෙම සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා යොජනා කළ හැකි පියවර ලෙස පාඩම් ඒකක සඳහා කෙටි ප්‍රශ්න සකස් කර පිළිතුරු ලිවීමට සිසුන් යොමු කිරීම, දැනුම මිනුම තරග පැවැත්වීම වැනි ක්‍රමවේද පෙන්වා දිය හැකි ය.

2 ප්‍රශ්නය

| | |
|---|---|
| **(02) අපේක්ෂණය :** | ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන අංග ලක්ෂණ හා ගුණාංග පිළිබඳ දැනුම හා විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම. |

**2.** (i) ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන මැතිවරණ අවස්ථා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක විරුද්ධ පක්ෂය විසින් ඉටු කළ යුතු කාර්ය **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) දේශපාලන පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප **දෙකක්** නම් කරන්න.

(b) තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

2 (i) ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන මැතිවරණ අවස්ථා

- ★ ජනාධිපතිවරණය
- ★ මහ මැතිවරණය (පාර්ලිමේන්තු මැතිවරණය)
- ★ පළාත් සභා මැතිවරණය
- ★ පළාත් පාලන මැතිවරණය (මහනගර සභා/නගර සභා/ප්‍රාදේශීය සභා)

**මේවායින් දෙකක් නම් කිරීම ලකුණු 01 + 01 = ලකුණු 02**

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක විරුද්ධ පක්ෂය විසින් ඉටු කළ යුතු කාර්යයන්

- ★ ආණ්ඩු පක්ෂය විසින් ඉටු කරනු ලබන යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දීම.
- ★ ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳ සංවර්ධනාත්මක විවේචන තුළින් ආණ්ඩුව සුමගට යොමු කිරීම.
- ★ ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්වලට විරුද්ධත්වය දැක්වීම.
- ★ වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට ක්‍රියා කිරීම.
- ★ ජාතික සංවර්ධනයට අවශ්‍ය නිවැරදි මහජන මතය ගොඩනැගීම

**මෙවැනි කාර්යයන් තුනක් සඳහන් කිරීම ලකුණු 01 x 3 = ලකුණු 03**

(iii) (a) දේශපාලන පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප

- ★ ඒක පක්ෂ
- ★ ද්වි පක්ෂ
- ★ බහු පක්ෂ

**මේවායින් දෙකක් නම් කිරීම = ලකුණු 02**

(b) තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ

- ★ ජනමත නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම
- ★ අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම
- ★ ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම.
- ★ ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාව සැලසීම
- ★ බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම

**මෙවැනි කරුණු තුනක් සඳහන් කිරීමට**
**(ලකුණු (a) 2 (b) 3) = ලකුණු 05**

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




2 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 78% ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10 කි.
මෙයින් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 26% ක්
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 32% ක්
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 18% ක් හා
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 24% ක්
වශයෙන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නයට 24%ක පිරිසක් ලකුණු 08 හෝ ඊට වඩා ලබා ඇති අතර, අයදුම්කරුවන්ගෙන් 26%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 02 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ කොටස් 3 ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වේ. එහි පහසුතාව 88%කි. එසේම පහසුතාව අඩු ම අනුකොටස වන්නේ (iii) (b) ය. එහි පහසුතාව 37%කි.

දෙවන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 78% කි. මෙහි (i) කොටස 88% ක පහසුතාවක් පෙන් වූ අතර (ii) කොටස සඳහා 55% ක පහසුතාවක් ද, (iii) කොටසෙහි (a) සඳහා 69% ක් ද, (b) සඳහා 37% ක ද පහසුතාවක් පෙන්නුම් කරයි. මෙහි වැඩි ම පහසුතාවක් පෙන්වා ඇත්තේ පළමු කොටස වන අතර ශ්‍රී ලංකාවේ මැතිවරණ ඇසුරින් මෙම ප්‍රශ්නය සැකසී ඇති නිසා අයදුම්කරුවන්ට වඩාත් ප්‍රායෝගික වීම මෙම පිළිතුරෙහි සාර්ථකත්වයට බලපා ඇති බව කිව හැකි ය.

මෙහි (ii) කොටසේ පහසුතාව 55% ක් වන අතර අවම පහසුතාවක් ඇති පිළිතුර වන්නේ (iii) කොටසේ (b) අනු කොටසයි. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ පිළිබඳ සිසුන්ට නිසි අවබෝධයක් නොවීම මෙම අඩු සාධන මට්ටමට හේතු වී ඇති බව කිව හැකි ය. මෙම පහසුතාව වර්ධනය කිරීම සඳහා නිරන්තර අභ්‍යාස කරණයෙහි යෙදවීම, පෙළපොත පරිහරණය සඳහා පෙළඹවීම වැනි ක්‍රියාකාරකම්වල යෙදවීම වඩාත් යෝග්‍ය වේ.

3 ප්‍රශ්නය

| | |
|---|---|
| **(03) අපේක්ෂණය :** | **බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ හා එවැනි සමාජයක පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම් පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම** |

**3.** (i) රටක ආර්ථික සංවර්ධනය අඩාල වීමට හා සමාජ සාධාරණත්වය බිඳවැටීමට බලපාන හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක කිරීමෙන් උදා කරගත හැකි යහපත් ප්‍රතිඵල **තුනක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

3 (i) රටක ආර්ථික සංවර්ධනය අඩාලවීමට හා සමාජ සාධාරණත්වය බිඳවැටීමට බලපාන හේතු

- ★ අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගතවීම.
- ★ රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමභාවය.
- ★ රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
- ★ නිලධාරිවාදය
- ★ රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය අවම වීම
- ★ අල්ලස් හා දූෂණය ඉහළ යාම.
- ★ රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරවීම.
- ★ පෞද්ගලික අංශය ජාතික අභිලාෂ නොතකා හැරීම.
- ★ උචිත තාක්ෂණය යොදා නොගැනීම.
- ★ නවීකරණයන් හඳුනා නොගැනීම.
- ★ දේශපාලන බලය අවභාවිතයට ලක්වීම.

**මෙවැනි හේතු දෙකක් දැක්වීම ලකුණු 01 + 01 = ලකුණු 02**

(ii) බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග

- ★ එකිනෙකාගේ සංස්කෘතීන් ගැන හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම.
- ★ එකිනෙකාට ගරු කිරීම.
- ★ අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම
- ★ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
- ★ ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
- ★ සාමූහිකත්වය වර්ධනය කිරීම
- ★ එක්සත්ව කටයුතු කිරීමෙන් ජයග්‍රහණ ලබා ගැනීමට පහසුබව අවබෝධ කර ගැනීම.
- ★ අනෙකුත් ජනවර්ගවල භාෂාවන් ඉගෙනීම හා භාවිතය.
- ★ සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ★ අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම.
- ★ සමානාත්මතාව

**මෙවැනි ගුණාංග තුනක් සඳහන් කිරීම ලකුණු 03**

(iii) බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක කිරීමෙන් උදාකරගත හැකි යහපත් ප්‍රතිඵල

- ★ ජන වර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වේ.
- ★ එකිනෙකා අතර අවබෝධය පුළුල් වේ.
- ★ පාලන කටයුතු සඳහා සියලුම ජනවර්ග හා ජන කණ්ඩායම්වල සහභාගීත්වය වර්ධනය වේ.
- ★ එකිනෙකාට ගරු කිරීමට හුරු වේ.
- ★ ආගමික හා සංස්කෘතික විවිධතා නොසලකා සහජීවනයෙන් කටයුතු කිරීමට පෙළඹෙයි.
- ★ නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත්වීමට පුරුදුවේ.
- ★ විනිවිදභාවයෙන් කටයුතු කෙරේ.

**මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම**
**කරුණු තුන නම් කිරීමට = ලකුණු 03**
**විස්තරයට = ලකුණු 02**
**ලකුණු 05**

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




3 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 63% කි. මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 23%ක්
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 32%ක්
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 21%ක් හා
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 24%ක්
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 24% ක් වන අතර, 23% ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02 හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ කොටස් 3 ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (ii) වේ. එහි පහසුතාව 70% කි. එසේ ම පහසුතාව අඩු ම කොටස වන්නේ (i) ය. එහි පහසුතාව 36% කි.

තුන්වන ප්‍රශ්නය තෝරා ගන්නා ලද අපේක්ෂක ප්‍රතිශතය 63% කි. මෙම ප්‍රශ්නයේ කොටස් සඳහා ලබා ගෙන ඇති ලකුණු සලකා බලන විට (i) කොටස 36% ක පහසුතාවක් ද, (ii) කොටස 70% ක පහසුතාවක් ද, (iii) කොටස 54% පහසුතාවක් ද, පෙන්වා ඇත. මෙහි අඩු ම පහසුතාවක් දක්වා ඇත්තේ (i) කොටසටයි. රටක ආර්ථික සංවර්ධනය අඩාල වීමට හා සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතු පිළිබඳව ඇති දැනුම අල්ප වීම මෙයට හේතු වී ඇත. මෙම පහසුතාව ඉහළ නැංවීම සඳහා සංවර්ධන සංකල්පය පිළිබඳවත්, සමාජ සාධාරණත්වය පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් ලබා දීමට සුදුසු වන සේ ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කිරීම සුදුසු වේ.

(ii) කොටසින් අසා ඇති බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු ප්‍රගුණ කළ යුතු ගුණාංග පිළිබඳව සිසුන් තුළ ප්‍රමාණවත් අවබෝධයක් පවතින බව කිව හැකි ය. එයට පෙන්වා ඇති 70% ක් වූ පහසුතාව තුළින් එය පැහැදිලි වේ.

(iii) කොටස සඳහා පහසුතාව 54% කි. එය සාමාන්‍ය තත්වයකි. පිළිතුරට අදාළ කරුණු දැක්වුව ද විස්තර කිරීමේ දී, දක්වා ඇති ගැටලුකාරී ස්වභාවය එහි පහසුතාව සාමාන්‍ය තත්වයක පැවතීමට හේතු වී ඇත. මෙම තත්වය මඟ හරවා ගැනීම සඳහා ව්‍යුහගත අභ්‍යාසකරණය නිරන්තරයෙන් ම සිදු කිරීම සුදුසු බවට යෝජනා කළ හැකි ය.

මෙම ඒකකය සාකච්ඡා කිරීමේ දී විවිධ ජාතීන්ගේ උත්සව පැවැත්වීම, ජාතීන් අතර සහයෝගීතාව වර්ධනය වන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම, විවිධ ජාතීන්ගේ උත්සව නැරඹීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය වැනි ක්‍රමවේද මෙන් ම ඒ සඳහා අදාළ වූ බාහිර ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ ආකල්ප හා අවබෝධය ප්‍රගුණ කළ හැකි ය.

**4 ප්‍රශ්නය**

| |
|---|
| (04) අපේක්ෂණය : ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම. |

**4.** (i) ගැටුම් ඇති වීමට බලපාන ප්‍රධාන මූල **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරුවකු තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4 (i) ගැටුම් ඇතිවීමට බලපාන මූල

- ★ වාර්ගිකත්වය
- ★ දේශපාලන මතවාද
- ★ සමාජ ආර්ථික තත්ත්වය
- ★ ආගමික මතවාද

**මින් මූල දෙකක් නම් කිරීම ලකුණු 02**

(ii) මැදිහත්කරුවෙකු තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු

- ★ දෙපාර්ශවය ම පිළිගන්නා අපක්ෂපාතී පුද්ගලයෙකු වීම.
- ★ ගැටුම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති අයෙකු වීම.
- ★ තමාගේ විසඳුම්, තීන්දු ඔවුන් මත පටවන්නෙකු නොවීම.
- ★ දෙපාර්ශවයට ම බලපෑම් එල්ල නොකිරීම.
- ★ දෙපාර්ශවයේ ම එකඟතාව මත විසඳුම් කරා යොමු කරවීම.
- ★ ඍජුව මුණ ගැසීමට නොහැකි අවස්ථාවල වෙන වෙන ම හමු වී අදහස් ලබාගෙන දෙපාර්ශවයට ම සන්නිවේදනය කිරීම.
- ★ නම්‍යශීලී විසඳුම් කරා යොමුකර "ජය - ජය" විසඳුම් ලබාදීම.

**මෙවැනි කරුණු තුනක් සඳහන් කිරීම ලකුණු 01 × 3 = ලකුණු 03**

(iii) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමේ වැදගත්කම

- ★ ජීවිත හානි වැළැකීම.
- ★ සම්පත්/දේපල හානි වැළකීම
- ★ මූලික හා මානව අයිතීන් ආරක්ෂාවීම.
- ★ මානසික ආතතිය අවම වීම.
- ★ පුද්ගල මානසිකත්වය ඉහළ යාම.
- ★ ආත්ම ගෞරවය සුරැකීම
- ★ සාමය හා ආරක්ෂාව සුරක්ෂිත වීම.
- ★ දේශපාලන ස්ථාවරත්වය
- ★ ආර්ථික ස්ථාවරත්වය
- ★ ජාතික ඒකාබද්ධතාව ඇතිවීම.
- ★ රට සමෘද්ධිමත් වීම.

**මෙවැනි කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කිරීම**
**කරුණු තුනට = ලකුණු 03**
**පැහැදිලි කිරීමට = ලකුණු 02**
**ලකුණු 05**

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




හතර වන ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 86% කි. මෙම ප්‍රශ්නයට ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 32% ක්
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 33% ක්
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 18% ක් හා
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 17% ක්
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 08 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 17% ක් වන අතර, 32%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ කොටස් 3 ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (ii) වන අතර එහි පහසුතාව 55%කි. පහසුතාව අඩු ම කොටස වන (i) හි පහසුතාව 21% කි.

මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය 86% කි. එහි (i), (ii) හා (iii) කොටස්වලට පිළිවෙලින් 21%, 55%, 49% ලෙස පහසුතා දක්වා ඇත. මෙහි (i) කොටස වූ ගැටුම් ඇති වීමට බලපාන මූල නම් කිරීම සඳහා අවම පහසුතාව වන 21% පෙන්නුම් කර ඇත. ඒ සඳහා බලපා ඇති ප්‍රධාන හේතුව වන්නේ ගැටුම් ඇති වීමට බලපාන ප්‍රධාන මූල සහ ගැටුම් ඇතිවන ආකාර වෙන් වෙන්ව හඳුනා ගැනීමට නොහැකි වීමයි. මේ සඳහා ගැටුම් ඇති වීමට බලපාන මූල සහ ගැටුම් ඇතිවන ආකාර පිළිබඳව වෙන් වෙන්ව පැවරුම් හා ක්‍රියාකාරකම් තුළින් දැනුම හා අවබෝධය ලබා දීම වැදගත් වේ.

(ii) කොටසින් අසා ඇති මැදිහත්කරුවකු තෝරා ගැනීමේ දී සැළකිය යුතු කරුණු පිළිබඳව දක්වා ඇති පහසුතාව 55% කි. මින් ගම්‍ය වන්නේ මේ පිළිබඳව අපේක්ෂකයන් තුළ සාමාන්‍ය අවබෝධයක් තිබුණ බවකි. එය තව දුරටත් වර්ධනය කර ගැනීම සඳහා පෙළ පොත කෙරෙහි වැඩි අවධානයක් යොමුකිරීම, අභ්‍යාස කරවීම, භූමිකා රංගන වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ගැටුම් නිරාකරණය පිළිබඳව අවබෝධය තහවුරු කිරීම වැනි ක්‍රමවේද අනුගමනය කිරීම වඩා ප්‍රතිඵලදායී විය හැකි ය.

ගැටුම් සාමකාමීව විසඳා ගැනීමේ වැදගත්කම ඇසුරින් අසා ඇති (iii) කොටස සඳහා පෙන්වා ඇති පහසුතාව 49% කි. මෙය සාමාන්‍ය මට්ටමක් වන අතර අපේක්ෂකයන් තුළ විශ්ලේෂණ හැකියාව අඩු වීම ඒ සඳහා බලපා ඇත. කරුණු පැහැදිලිව ඉදිරිපත් කළ හැකි වන සේ අභ්‍යාස කරවීමට හුරු කිරීම, පෙළ පොත පරිශීලනයට යොමු කිරීම සහ විෂය ඒකකය රසවත්ව ග්‍රහණය කර ගැනීමට හැකි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම වැනි ක්‍රමවේද අනුගමනය කළ යුතු ය.

**5** ප්‍රශ්නය

| | |
|---|---|
| **(05) අපේක්ෂණය :** | **ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ පද්ධතියේ ස්වභාවය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය මැනීම.** |

**5.** (i) නීතියේ මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) දේශීය නීතියට අයත් ප්‍රභේද **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියේ ඉහළ ම අධිකරණ **තුන** නම් කර, ඉන් **එකක** ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

5 (i) නීතියේ මූලාශ්‍ර
- ★ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- ★ විවිධ අණ පනත්
- ★ අධිකරණ තීන්දු
- ★ නීති විශාරදයන්ගේ මත හා විද්‍යාත්මක සිද්ධාන්ත
- ★ සිරිත් විරිත්
- ★ ආගම

**මෙවැනි මූලාශ්‍ර දෙකක් නම් කිරීම ලකුණු 01 + 01 = ලකුණු 02**

(ii) දේශීය නීතියට අයත් ප්‍රභේද
- ★ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය
- ★ අපරාධ නීතිය
- ★ සිවිල් නීතිය

**මෙම ප්‍රභේද තුන නම් කිරීමට ලකුණු 01 x 03 = ලකුණු 03**

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියේ ඉහළ ම අධිකරණ තුන නම් කර, ඉන් එකක ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීම.

☛ **ඉහළම අධිකරණ තුන**
- ★ ශ්‍රේෂ්ඨාධිකරණය
- ★ අභියාචනාධිකරණය
- ★ පළාත්බද මහාධිකරණය/ මහාධිකරණය

**මෙම අධිකරණ තුන නම් කිරීම**

☛ **ක්‍රියාකාරීත්වය**
- ★ ශ්‍රේෂ්ඨාධිකරණය : ප්‍රධානියා අගවිනිසුරුය
  - ● අවසාන හා ඉහළ ම අභියාචනාධිකරණ බලය හිමි උපරිමාධිකරණයයි.
  - ● ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම.
  - ● මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පෙත්සම් විභාග කිරීම.
  - ● උපදේශාත්මක අධිකරණ බලය
  - ● ජනමත විචාරණ/ ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
  - ● අවසාන අභියාචනාධිකරණ බලය
  - ● පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ අධිකරණ බලය
  - ● රීති සැකසීමේ බලය.
  - ● දෝෂාභියෝග විනිශ්චය කිරීම.

**අවම වශයෙන් මෙවැනි කරුණු තුනක්වත් විස්තරයට ඇතුළත් විය යුතුය.**

- ★ අභියාචනාධිකරණය
  - ● ප්‍රධානියා අභියාචනාධිකරණ සභාපතිවරයාය.
  - ● අභියාචනාධිකරණ විනිසුරුවන් පත්කිරීම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මත ජනාධිපතිවරයා විසින් කරනු ලැබේ.
  - ● මහාධිකරණ හා වෙනත් අධිකරණවලින් දෙනු ලබන තීන්දුවලට එරෙහි අභියාචනා විභාග කිරීමේ බලය

- පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
- විවිධ ආඥා නිකුත් කිරීමේ බලය (හබයාස් කෝපුස්, සර්ටියෝරාරි, මැන්ඩාමුස්, ක්වෝවොරන්ටෝ හා තහනම් ආඥා)
- මුල් අවස්ථා අධිකරණයක වාර්තා විමර්ශනය කිරීම හා පරීක්ෂා කිරීම.

**යටත් පිරිසෙයින් මෙවැනි කරුණු තුනක්වත් පිළිතුරට ඇතුළත් විය යුතුය.**

★ පළාත්බද මහාධිකරණය
- පළාත්බද මහාධිකරණය සඳහා විනිසුරුවන් පත්කිරීම අගවිනිසුරු විසින් කරනු ලැබේ.
- වාණිජ ආරවුල් විසඳීම
- මහේස්ත්‍රාත් හා දිසා අධිකරණ තීන්දුවල අභියාචනා විසඳීම
- කම්කරු විනිශ්චය සභා තීරණ පිළිබඳ අභියාචනා විසඳීම
- පළාත් සභා බල ප්‍රදේශය තුළ හබයාස් කෝපුස් රිට් ආඥා ලබාදීම
- පළාත් සභා බල ප්‍රදේශය තුළ රිට් ආඥා ලබා දීම.

★ මහාධිකරණය
- බරපතල අපරාධ පිළිබඳ අධිකරණ බලය (මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, විශාල මංකොල්ල, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ ආදී)
- නාවික අධිකරණ බලය.
- ශ්‍රී ලංකා අහස් තීරයේදී සිදු කරන වැරදි
- අධිකරණ සේවා කොමිෂන් සභා තීරණ විමර්ශනය කිරීම.

**යටත් පිරිසෙයින් මෙවැනි කරුණු දෙකක්වත් පිළිතුරකට ඇතුළත් විය යුතුය.**

**අධිකරණ තුන නම් කිරීමට = ලකුණු 03**

**එහි අධිකරණ ක්‍රියාකාරිත්වය විස්තර කිරීමට = ලකුණු 02**

**ලකුණු 05**

**5 ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 71% ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 16% ක්
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 33% ක්
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 22% ක් හා
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 29% ක්
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8 හෝ ඊට වඩා වැඩියෙන් ලබාගත් පිරිස 29%ක් වන අතර, 16% ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් 3ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (iii) ය. එහි පහසුතාව 72%කි. එසේම පහසුතාව අඩු ම කොටස වන්නේ (ii) ය. එහි පහසුතාව 49% කි.

මෙම ප්‍රශ්නය 71% ක අපේක්ෂකයන් ප්‍රමාණයක් තෝරා ගෙන ඇත. නීතියේ මූලාශ්‍ර ඇතුළත් වූ (i) කොටසෙහි පහසුතාව 66% කි. නීතියේ ප්‍රභේද පිළිබඳව ඇසූ (ii) කොටසෙහි පහසුතාවය 49% කි. (iii) කොටසෙහි පහසුතාවය 72% කි. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ඇසුරෙන් අසා ඇති මෙම කොටසට ඉහළ පහසුතාවක් ලබා ඇත.

මෙහි අඩු ම පහසුතාවයක් පෙන්වා ඇත්තේ දේශීය නීතියේ ප්‍රභේද ඇසුරින් ඇසූ ප්‍රශ්නයටයි. පෙළ පොත නිසි පරිදි පරිහරණය නොකිරීම මේ සඳහා බලපා ඇති ප්‍රධාන හේතුවයි. මෙහි සාර්ථක බව වර්ධනය කිරීම සඳහා පෙළ පොත පරිශීලනයට සිසුන් යොමු කිරීමත්, විවෘත ග්‍රන්ථ පරීක්ෂණ නිරන්තරයෙන් සිදු කිරීමත් කළ හැකි ය.

මෙහි වැඩි ම පහසුතාවක් දක්වා ඇති (iii) කොටසින් අසා ඇත්තේ ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳවයි. මේ පිළිබඳව අපේක්ෂකයන් තුළ මනා අවබෝධයක් ඇති බව පැහැදිලි ය. අධිකරණ ආයතන පිළිබඳව විමර්ශනය කරමින් පිළිතුරු ලියවීම, ඒවා ඇගයීම හා සාකච්ඡා කිරීම ද, ක්ෂේත්‍ර චාරිකා මගින් දැනුම තහවුරු කර ගැනීමට අවස්ථාව ලබා දීම වැනි ක්‍රමවේද භාවිත කිරීමෙන් සාර්ථකව පිළිතුරු ලිවීමේ කුසලතාවය තව දුරටත් වර්ධනය කළ හැකි ය.

## 6 ප්‍රශ්නය

| | |
|---|---|
| **(06) අපේක්ෂණය :** | මානව අයිතිවාසිකම්වල වැදගත්කම හා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහාගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම. |

**6.** (i) මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 යි)

(ii) මානව හිමිකම්වල ස්වභාවය අනුව බෙදා දැක්විය හැකි අයිතිවාසිකම් වර්ග **තුනක්** සඳහන් කරන්න.
(ලකුණු 03 යි)

(iii) (a) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී පදනම් කරගත් විශේෂ අරමුණු **දෙකක්** නම් කරන්න.

(b) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න.
(ලකුණු 05 යි)

6 (i) මානව හිමිකම් දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා දෙකක්
- ★ ක්‍රි.ව. 1215 - මැග්නා කාර්ටා ගිවිසුම
- ★ ක්‍රි.ව. 1689 - බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පනත
- ★ ක්‍රි.ව. 1776 - ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
- ★ ක්‍රි.ව. 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- ★ ක්‍රි.ව. 1917 - රුසියානු විප්ලවය.
- ★ ක්‍රි.ව. 1948 - මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

**මින් අවස්ථා දෙකක් නම් කිරීම ලකුණු 01 + 01 = ලකුණු 02**

(ii) මානව හිමිකම්වල ස්වභාවය අනුව බෙදා දැක්විය හැකි අයිතිවාසිකම් වර්ග
- ★ සිවිල් අයිතිවාසිකම්
- ★ දේශපාලන අයිතිවාසිකම්
- ★ ආර්ථික අයිතිවාසිකම්
- ★ සමාජයීය අයිතිවාසිකම්
- ★ සංස්කෘතික අයිතිවාසිකම්

**මින් තුනක් සඳහන් කිරීම ලකුණු 01 x 3 = ලකුණු 03**

(iii) (a) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී පදනම් කරගත් විශේෂ අරමුණු
- ★ ළමයාගේ ආරක්ෂාව
- ★ ළමයාගේ පැවැත්ම
- ★ ළමයාගේ සංවර්ධනය
- ★ ළමයාගේ සහභාගීත්වය

**මින් දෙකක් සඳහන් කිරීම ලකුණු 02**

(b) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියා මාර්ග

- ★ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම.
- ★ ළමයින් සම්බන්ධ සැම ක්‍රියාවලියක දී ම හා ඔවුන් පිළිබඳව ගනු ලබන සැම තීරණයක දී ම "ළමයාගේ උපරිම යහපත" සැලසෙන පරිදි කටයුතු කිරීම.
- ★ ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම.
- ★ ළමයින් සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම හා බලය පැවරීම.
- ★ පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටුවීම
- ★ සෑම පොලිසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටුවීම.

★ ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිහිටුවීම (Child Line Sri Lanka - 1929)

**මෙවැනි ක්‍රියාමාර්ග තුනක් දැක්වීම ලකුණු 03**
**(ලකුණු *(a)* 2 *(b)* 3) = ලකුණු 05**

**6 ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 30% ක් පමණ වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 39% ක්
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 27% ක්
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 16% ක් හා
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 18% ක්
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 08 ට හෝ ඊට වඩා ලබාගත් පිරිස 18% ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 39% ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 02 හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ කොටස් 3 ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩි ම අනුකොටස (iii) (a) වේ. එහි පහසුතාව 57% කි. එසේ ම පහසුතාව අඩු ම කොටස වන්නේ (ii) ය. එහි පහසුතාව 42% කි.

මෙම ප්‍රශ්නය තොරාගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 30% ක් වූ අවම මට්ටමක පවතී. මෙම ප්‍රශ්නයේ (i), (ii) හා (iii) කොටස්වල පහසුතාව පිළිවෙලින් 52%, 42% සහ (iii) (a) 57% සහ (iii) (b) 44% ක් ද වේ.

මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය අඩු වීමට බලපා ඇත්තේ මානව හිමිකම් පිළිබඳව අපේක්ෂකයන් තුළ නිවැරදි අවබෝධයක් නොතිබීමයි. මෙහි (i) කොටස වන මානව හිමිකම් දිනා ගැනීමේ ඓතිහාසික අවස්ථා පිළිබඳ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පැවතීමට හේතුව ලෙස මානව හිමිකම්වල ඉතිහාසය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම අල්ප වීම පෙන්වා දිය හැකි ය. මෙහි ඵලදායීතාව වැඩිකරලීම සඳහා මානව හිමිකම් පිළිබඳව ලියවී ඇති පනත් පන්ති කාමරය තුළට ගෙනවිත් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට දැක බලා ගැනීමට අවස්ථාව ලබා දී, ඒ පිළිබඳව රුචිකත්වයක් ඇතිකළ හැකි ය.

මෙම ප්‍රශ්නයේ 42% ක් වූ අඩු පහසුතාවක් පෙන්නුම් කරන්නේ (ii) කොටස සඳහා ය. එනම් මානව හිමිකම්වල ස්වභාවය අනුව බෙදා දැක්විය හැකි අයිතිවාසිකම් වර්ග පිළිබඳවයි. මෙහි දී අපේක්ෂකයින් තුළ මානව හිමිකම් නිශ්චිතව බෙදා දැක්වීමේ කුසලතා ප්‍රගුණ කර නොමැති බව පැහැදිළිව පෙනෙන කරුණක් වී ඇත. මානව හිමිකම් වර්ග වගුගත කර ඒ යටතේ එන අයිතිවාසිකම් දක්වා, ඒවා නිතර ඇස ගැටෙන සේ පංති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීම මගින් පිළිතුරු ලිවීමේ කුසලතා වර්ධනය කළ හැකි ය.

## 7 ප්‍රශ්නය

| |
|---|
| **(07) අපේක්ෂණය :** පරිසරය හා මිනිස් කටයුතු අතර ඇති සබඳතාව හා පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම. |

**7.** (i) පරිසර පද්ධතිය සකස් වී ඇති අජෛවී සංරචක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) තිරසාර සංවර්ධනයක් පවත්වාගෙන යාම සඳහා රජය මගින් ඉටු කළ යුතු යුතුකම් **තුනක්** සඳහන් කොට, ඉන් **එකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

7 (i) පරිසර පද්ධතිය සකස්වී ඇති අජෛවී සංරචක
- ★ වායුගෝලය
- ★ ජල ගෝලය
- ★ ශිලා ගෝලය
- ★ දේශගුණය
- ★ පාෂාණ
- ★ පස්
- ★ භූ ලක්ෂණ
- ★ සාගර
- ★ මිරිදිය ජලාශ
- ★ හිරු එළිය

**මෙවැනි සංරචක දෙකක් සඳහන් කිරීම ලකුණු 01 + 01 = ලකුණු 02**

(ii) පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවා
- ★ ජීව උපකාරක සේවා
  (හිරු එළිය/වාතය/ජලය)
- ★ ආර්ථික උපකාරක සේවා
  **අමුද්‍රව්‍ය**
  (භූමිය, ඛනිජ, රසායනික මූලද්‍රව්‍ය, දැව, ශාක, සත්ව, ආහාරපාන)

  **ශක්තිය**
  (සූර්ය බලය, පොසිල ඉන්ධන, ජීවවායු, භූ තාපය, ජල විදුලිය, සුළං බලය)
- ★ අපද්‍රව්‍ය අවශෝෂණ සේවා

**මෙම සේවා තුනක් සඳහන් කිරීම ලකුණු 01 + 01 + 01 = ලකුණු 03**

(iii) තිරසර සංවර්ධනයක් පවත්වාගෙන යාම සඳහා රජය මගින් ඉටු කළ යුතු යුතුකම්
- ★ පරිසර සංරක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ★ පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිෂ්පාදකයින් දිරිගැන්වීම
- ★ පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා පාරිභෝජනයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
- ★ පරිසරයට අදාළ නීතිරීති සම්පාදනය හා බල ගැන්වීම
  (නිදු : 1980 ජාතික පරිසර පනත)
- ★ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම (E.I.A)
- ★ පරිසර ආරක්ෂණ බලපත්‍ර (E.P.A) ක්‍රියාත්මක කිරීම.
- ★ පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම
- ★ පරිසර ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.
- ★ හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
- ★ අධිපාරිභෝජනය සීමා කරවන පරිසර හිතකාමී ජීවන ක්‍රමයට ජනතාව යොමු කිරීම

**මෙවැනි තුනක් සඳහන් කිරීමට = ලකුණු 03**
**එකක් පිළිබඳ විස්තර කිරීමට = ලකුණු 02**
**ලකුණු 05**

**7 වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 67% ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 28% ක්
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 36% ක්
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 18% ක් හා
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 18% ක්
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 18%ක් වන අතර, 28% ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02 හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ කොටස් 3 ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වේ. එහි පහසුතාව 62% කි. එසේ ම පහසුතාව අඩු ම කොටස වන්නේ (iii) ය. එහි පහසුතාව 42% කි.

හත්වන ප්‍රශ්නය 67% ක අපේක්ෂකයන් ප්‍රමාණයක් විසින් තෝරා ගෙන ඇති ප්‍රශ්නයකි. මෙහි (i) කොටස සඳහා පහසුතාව 62% කි. මෙය සතුටුදායක මට්ටමකි. පරිසර පද්ධතිය සකස් වී ඇති අජීවී සංරචක පිළිබඳ දැනුම විමසා බැලීම මෙම කොටසින් සිදු කර ඇති අතර ඒ සඳහා සාර්ථකව පිළිතුරු ලබා දී ඇත. මෙම සාධන මට්ටම් තව දුරටත් වැඩි දියුණු කිරීම සඳහා රූප සටහන් සහ ප්‍රස්තාර ඇසුරින් දැනුම තහවුරු කිරීම වැදගත් ය.

(ii) කොටස සඳහා දක්වා ඇති පහසුතාවය 56% කි. "පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවා"වැනි සරල ප්‍රශ්නයක් සඳහා අපේක්ෂකයන් පෙන්වා ඇති ප්‍රතිචාරය ප්‍රමාණවත් නැත. සමස්ත සමාජයේ ම පවතින පාරිසරික අවධානය අඩුවීම අපේක්ෂකයන් කෙරෙහි බලපා තිබීම මේ සඳහා හේතු වී ඇත. වරිතායනය කරගත් කරුණු අසුරින් ප්‍රශ්න පත්‍ර ආකෘතියකට යොමු කරවීමට ගුරු භවතුන් සහය දැක්වීමෙන් සාධන මට්ටම වර්ධනය කර ගත හැකි ය. පරිසර හිතකාමී ආකල්ප වර්ධනය වන ලෙස ව්‍යාපෘති දියත් කිරීම කෙරෙහි ගුරු භවතුන්ගේ අවධානය වඩාත් යොමුවිය යුතු ය.

මෙහි (iii) කොටස තිරසර සංවර්ධනය සඳහා රජය මගින් ඉටු කළ යුතු යුතුකම් පිලිබඳව විමසා බලයි. මෙහි පහසුතාව 42% ක් වන අතර තිරසර සංවර්ධන සංකල්පය පිළිබඳ පැහැදිලි අවබෝධයක් සිසුන් තුළ නොමැති වීම මෙයට හේතු වී ඇති බව පෙනී යයි. මෙම කොටසෙහි පහසුතාව වැඩි දියුණු කිරීම සඳහා තිරසර සංවර්ධනය අර්ථකථනය කර ප්‍රදර්ශන පුවරු පංති කාමරරය තුළ ඇස ගැටීමට අවස්ථාව ලබා දීම හා, සංවර්ධනය හා තිරසර සංවර්ධනය යන මාතෘකා යටතේ විවාද පැවැත්වීම වැනි සිසු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ හැකි ය.

## III කොටස

**3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

* ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. කුමන ප්‍රශ්නය අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු අතර, ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයකින් ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ගත යුතු ය. එම නිවැරදි පිළිතුරෙහි අංකය බහුවරණ පිළිතුරු පත්‍රයේ කතිර ලකුණු යොදා සලකුණු කළ යුතු ය.

* II පත්‍රයේ (1) පළමු ප්‍රශ්නය සඳහා අනිවාර්යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය.

* පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු සැපයිය යුතු ය.

* අයදුම්කරුවන්ගේ විභාග අංක සෑම පිටුවක ම ඇතුළත් කළ යුතු ය.

* ප්‍රශ්න අංකය, කොටස් අංකය, අනු කොටස් අංක නිවැරදිව ලිවිය යුතු ය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දීර්ඝ විස්තර ඇතුලත් නොකිරීම මෙන් ම, විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවේ කෙටි පළිතුරු සැපයීම ද නොකළ යුතු ය.

* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

* II පත්‍රය සඳහා නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතු ය.

* පිළිතුරු ලිවීමේ දී රතු තීන්ත පෑන් සහ මකන දියර භාවිතා නොකළ යුතු ය.

* පිළිතුරු පත්‍රයෙහි, පිටු අංක නිවැරදිව අනුපිළිවෙළින් ඇමිණිය යුතු ය.

**විශේෂ උපදෙස් :**

* කරුණු දැක්වීම හා ඒවා පැහැදිලි කිරීම විස්තර කිරීම හෝ සනාථ කිරීම අනුව ප්‍රශ්නවල ලකුණු බර තබා ඇති බව තේරුම් ගත යුතු වීම.
* ව්‍යූහගත රචනා වර්ගයේ දී නිදසුන් සහ සාධක ඉදිරිපත් කළ යුතු වීම.
* ඇගයීමේ පහසුව සඳහා අවශ්‍ය තැන්හි දී ඡේද වෙන් කළ යුතු වීම.
* අනුපිළිවෙලින් පිළිතුරු නම් කිරීම කළ යුතු අවස්ථාවල ඒ සඳහා සැලකිලිමත් වීම.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා

* ඉගෙනුම් - ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය කිරීම.
* ඉගෙනුම් ආධාරක භාවිත කිරීම.
* විෂය ක්‍රියාකාරකම් ප්‍රබෝධජනක අයුරින් සංවිධානය කිරීම.
* සැලසුම් කරන ලද ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
* පිළිතුරු ලිවීමේ දී කරුණු සංවිධානය ප්‍රගුණ කිරීමේ අභ්‍යාස කරවීම.
* සම්පත් පුද්ගලයන්ගේ උදව් උපකාර ලබා ගැනීම.
* පාසල් අතර බුද්ධි මණ්ඩල සාකච්ඡා සංවිධානය කිරීම.
* විවාද හා ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
* මාධ්‍ය මගින් කාලීන තොරතුරු ලබා ගැනීමට යොමු කිරීම.
* පෙළපොත පරිහරණය සඳහා පෙළඹවීම.

**විදුහල්පතිවරුන් සඳහා උපදෙස් :**

* විෂය සංවර්ධනය සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම සහ අනුග්‍රහය තව දුරටත් පුළුල් අයුරින් ලබා දිය යුතු ය.
* ගුරුවරුන්ගේ විෂය සංවර්ධනය සඳහා කොට්ඨාස, කලාප, පළාත් සහ අමාත්‍යාංශ මට්ටමින් පවත්වන වැඩමුළු සඳහා අදාළ ගුරුභවතුන් සහභාගි කරවීමට කාරුණික විය යුතු ය.
* ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.
* ගුරුභවතුන්ට තම විෂයය පිළිබඳව වගකීම පැවරෙන පරිදි විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.
* සුභග සිසුන් උපස්ථම්භනය වන ලෙස ත්‍යාග සහ සහතික පත් ලබා දීම වැනි ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

## අයදුම්කරුවන් සඳහා යෝජනා :

* අදාළ පෙළපොත් පරිශීලනය කිරීම පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතු ය.
* දැනුම නිරන්තරයෙන් ම යාවත්කාලීන කර ගැනීම සඳහා බාහිර පොත්පත් හා සන්නිවේදන මාධ්‍ය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.
* නිරන්තරයෙන් ම ඒකක අවසානයේ අභ්‍යාසකරණය කළ යුතු ය.
* පුරවැසි අධ්‍යාපනය හදාරන අයකු ලෙස සුවිශේෂී වීමට ආකල්ප හා චර්යාමය වෙනසක් ඇති කර ගැනීමට අවධානය යොමු කළ යුතු ය.

## ගුරුභවතුන් සඳහා යෝජනා :

* ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මනාව සූදානම් වීම ඉතා වැදගත් වේ.
* විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශය, පෙළපොත හා බාහිර සම්පත් මූලාශ්‍ර පිළිබඳව ගුරුභවතුන් දැනුවත් වීම හා භාවිතය අත්‍යවශ්‍ය වේ.
* සම්පූර්ණ විෂය නිර්දේශය ම ආවරණය කළ යුතු ය.
* ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ක්‍රියාකාරකම්, සැලසුම් තක්සේරුව හා ඇගයීම යන කොටස් කෙරෙහි ගුරුභවතුන් වඩාත් අවධානය යොමු කළ යුතු ය.
* ගුරුවරයා ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ සාධන මට්ටම් අනුව අවස්ථානුකූලව නිර්මාණශීලී විය යුතු ය.
* ඉගැන්වීමේ දී ගවේෂණය තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමට ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට මග පෙන්විය යුතු ය.
* ප්‍රශ්න පත්‍රයේ ආකෘතිය හා අදාළව පිළිතුරු සැපයීමේ ශිල්පීය කුසලතා පිළිබඳව ශිෂ්‍ය - ශිෂ්‍යාවන් දැනුවත් කළ යුතු ය.
* ඉගෙනුමට ඉගැන්වීම පිළිබඳව ද ශිෂ්‍ය - ශිෂ්‍යාවන් දැනුවත් කළ යුතු ය.
* නිරන්තර අභ්‍යාස කරවීම තුළින් පිළිතුරු ලිවීම පිළිබඳව ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට මනා පුහුණුවක් ලබා දිය යුතු ය.
* කාලීන සමාජ තොරතුරු ගවේෂණය කෙරෙහි ශිෂ්‍ය - ශිෂ්‍යාවන් යොමු කළ හැකි ඉගෙනුම් අවස්ථා සම්පාදනය කළ යුතු ය.
* ගුරුවරයා විෂයය කරුණු පිළිබඳ ප්‍රවීණයෙකු විය යුතු අතර නවීන ක්‍රම ශිල්ප භාවිත කරමින්, දරුවන්ගේ සිත් ඇද ගන්නා අයුරින් විෂය කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව දියුණු කර ගත යුතු ය.